ඉදිරියට

2014 දෙසැම්බර් 28 වන ඉරිදා 1 කාණ්ඩය 4 පත්‍රය මිල - රු. 50.00

## සිරිකොත ප්‍රහාරය ඇමැති වීරවංශගේ වැඩක්

එක්සත් ජාතික පක්ෂ මූලස්ථානය ඉදිරිපිට ඉකුත් 24දා ඇතිවූ ගැටුම ඇමැති විමල් වීරවංශගේ සැළසුමක් බවත් ඔහු ඒ සඳහා රජයේ සේවකයන් පවා යොදාගෙන ඇති බවත් අනාවරණය වේ. ගැටුමට මුල් වූ 'ජාතික සංවිධාන එකමුතුවේ' විරෝධතා ව්‍යාපාරය සඳහා මැර කණ්ඩායම්ද යොදාගෙන තිබූ අතර එම පිරිස් පොලු මුගුරු අතැතිව පොලිස් නිලධාරින් සමීපයේම සිටින ආකාරයත් දකගත හැකිවිය. රාජකාරි සඳහා වාර්තා කළ ඉංජිනේරු සංස්ථා සේවකයන් සහ සංස්ථාවට අයත් වාහන ද මේ විරෝධතාවට යොදාගෙන තිබුණි.

මේ අතර පොදු අපේක්ෂකයා අත්අඩංගුවට ගැනීමට හැකියාව ලැබෙන ආකාරයේ චෝදනා සහ මඩ ප්‍රහාර එල්ල කිරීමේ සැළසුම් සහගත වැඩ පිළිවෙළක්ද ක්‍රියාත්මක වෙමින් පවතින බව වාර්තා වේ.

ඉකුත් ජනාධිපතිවරණයේදීද ඡන්ද විමසීම් අවසන් වනවාත් සමගම විපක්ෂයේ පොදු අපේක්ෂක ජෙනරාල් සරත් ෆොන්සේකා සිටි හෝටලය ප්‍රහාරක රථ සමග හමුදාව යොදවා වටකොට ඔහුව අත්අඩංගුවට ගැනීමට ආණ්ඩුව උත්සාහ කළේය.

# මහින්දගේ ප්‍රචාරක ව්‍යාපාරයෙන් වාසි මෛත්‍රීට!

මහින්ද රාජපක්ෂ මහතාගේ ජනපතිවරණ ප්‍රචාරක ව්‍යාපාරයද අර්බුදයට පත්ව ඇති බවත් එය ඡන්ද දායකයාගේ දේශපාලන පරිකල්පනයට ආමන්ත්‍රණය කිරීමට අසමත්ව ඇති අතර ඒ සමගම සන්ධානයේ අභ්‍යන්තර කැඩී බිඳීයාම් ද නිසා රජය ප්‍රචණ්ඩත්වයට යොමු වී ඇති හෙයින් රාජපක්ෂ මහතාගේ ජනපතිවරණ ව්‍යාපාරය සිරිසේන මහතාගේ ව්‍යාපාරයට ආධාර කරන එකක් වීම වැලැක් විය නොහැකිව ඇති බවත් කොළඹ විශ්වවිද්‍යාලයේ දේශපාලන විද්‍යා මහාචාර්ය ජයදේව උයන්ගොඩ පවසයි.

සුප්‍රකට දේශපාලන විචාරකයෙකු වන මහාචාර්ය උයන්ගොඩගේ නිරීක්ෂණය අනුව "... මේ වන විට ඉදිරියට ගොස් ඇති ජනපතිවරන ව්‍යාපාරය දෙස බලන විට පෙනෙන්නට තිබෙන දෙයක් නම් මහජන පරිකල්පනය ග්‍රහණය කොට ගැනීම සඳහා වූ තරගයෙන් මෛත්‍රීපාල සිරිසේන හා විපක්ෂ කඳවුර ඉදිරියෙන් සිටින බවයි."

ඉදිරි ජනපතිවරණය පිළිබඳව වැඩි දුරටත් සිය අදහස් හා ස්ථාවරයද දක්වන ඒම මහතා මෙසේ ද පවසයි. "මහින්ද රාජපක්ෂ මහතාගේ දෙවන ධුර කාලයේ දී ලංකාවේ ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රියාවලිය බරපතල පසු බෑමකට ලක් විය... 2010 සම්මත වූ 18 වන සංශෝධනයෙන් පසුව සිදු වූයේ මෙම ක්‍රියාවලිය කූටප්‍රාප්ත වීමයි... මේ ක්‍රියාවලිය නැවැත්වීම හා ආපසු හැරවීම ලංකාවේ ප්‍රජාතන්ත්‍රවාදයේ අනාගත චිරස්ථිතිය සඳහා අනිවාරය පූර්ව කොන්දේසියකි."

සිය ප්‍රකාශය අවසන් කරමින් මහාචාර්ය උයන්ගොඩ මෙසේ ද පවසයි. "ජනවාරි 08 වෙනිදා 'ආණ්ඩු වෙනසක්' සඳහා මා ඡන්දය දෙන්නේ ඒ නිසාය. ලංකාවේ ඡන්ද දායකයින්ගෙන් වැඩි දෙනා ද මේ අදහසම දරනු ඇතැයි මම අපේක්ෂා කරමි."

# මඩ අනද්දි මාට්ටු

විපක්ෂයේ පොදු අපේක්ෂක මෛත්‍රීපාල සිරිසේන සහ පොදු විපක්ෂයට එරෙහිව මඩ පෝස්ටර් මුද්‍රණය කරමින් තිබුණු මුද්‍රණාලයක් වැටලූ පොලිසිය සහ මැතිවරණ කොමසාරිස් කාර්යාලයේ නිලධාරිහු මුද්‍රණය කරමින් තිබූ මඩ පෝස්ටර්ද සමගින් එහි හිමිකරු සහ සේවකයන් දෙදෙනෙකු අත් අඩංගුවට ගෙන තිබේ. මැතිවරණ කොමසාරිස්වරයාට ලැබුණු තොරතුරක් මත මෙලෙස වටලා ඇත්තේ පන්නිපිටියේ පිහිටි මුද්‍රණාලයකි. වැටලීමෙන් පසු පොලිසිය මුද්‍රණාලයට සීල් තබා ඇත.

# සංගා සහ මහේල ජනපතිට බෑ කියති

මහින්ද රාජපක්ෂ ජනාධිපතිවරයාගේ මැතිවරණ ව්‍යාපාරයට සහාය දක්වන ලෙස ඔහු කළ ඉල්ලීමක් ශ්‍රී ලංකා ක්‍රිකට් කණ්ඩායමේ හිටපු නායකයන් දෙදෙනෙකු වන කුමාර සංගක්කාර සහ මහේල ජයවර්ධන ප්‍රතික්ෂේප කර තිබේ. කුමාර සංගක්කාර අරලිය ගහ මැඳුරට කැඳවා සිය මැතිවරණ ප්‍රචාරක ව්‍යාපාරයට සහාය දක්වන ලෙස ඉල්ලූ අවස්ථාවේදී සංගක්කාර එම ඉල්ලීම ප්‍රතික්ශේප කර ඇත. එසේ නම් ප්‍රචාරක දැන්වීමකට පෙනී සිටින්නැයි ජනාධිපතිවරයා කළ ඉල්ලීම ද ප්‍රතික්ෂේප කළ සංගක්කාර තමන් ක්‍රිකට් ක්‍රීඩා කරන්නේ රට වෙනුවෙන් පමණක් බව ජනාධිපතිවරයාට පවසා ඇතැයි අන්තර්ජාල පුවත් වාර්තා කළේය. ප්‍රචාරක දැන්වීමකට පෙනී සිටින ලෙස ජනාධිපතිවරයා මහේල ජයවර්ධනගෙන් කළ ඉල්ලීමද මහේල ප්‍රතික්ෂේප කර ඇත.

# දන්සැලක් වටලයි

මැතිවරණ නීති උල්ලංඝනය කරමින් ඡන්ද අල්ලස් ලෙස නොමිලේ භාණ්ඩ බෙදා දෙමින් තිබූ ස්ථානයක් ත්‍රිකුණාමල දිස්ත්‍රික් සහකාර මැතිවරණ කොමසාරිස් සජිත් වෙල්ගම සහ පොලිස් කණ්ඩායමක් විසින් වටලනු ලැබ තිබේ. කන්තලේ නගරයේ පිහිටි එම ස්ථානය එක්සත් ජනතා නිදහස් සන්ධානයේ මැතිවරණ ප්‍රචාරක මධ්‍යස්ථානයක් බවත් මැතිවරණ නිලධාරිහු සහ පොලිසිය එම ස්ථානයට යන විටත් නොමිලේ භාණ්ඩ බෙදා දෙමින් තිබී ඇති බවත් වාර්තාවේ. පොලිසිය පැමිණෙනු දුටු සැනින් එම ස්ථානයේ බඩු බෙදමින් සිටි සහ ලබාගනිමින් සිටි පිරිස් පලාගොස් ඇත.

සේරුවිල ආසනයේ ජනාධිපතිවරණ ප්‍රචාරක කටයුතු බාරව සිටින ජනාධිපති ලේකම්වරයකු ඉදිකළ බව කියන එම මධ්‍යස්ථානයේ තිබූ ප්ලාස්ටික් පුටු 200ක් සහ අභ්‍යාස පොත් විශාල සංඛ්‍යාවක් පොලිසිය බාරයට ගෙන තිබේ.

# මුතුහෙට්ටි කටුනායකින් රට පනී

නව ප්‍රජාතන්ත්‍රවාදී පෙරමුණේ ජනාධිපති අපේක්ෂක මෛත්‍රීපාල සිරිසේන මහතාගේ දේශපාලන රැළියක් සඳහා ගාල්ල, වඳුරඹ ප්‍රදේශයේ ඉදිකළ වේදිකාවට ගිනි කැබීමේ සිද්ධිය සම්බන්ධයෙන් අධිකරණයෙන් වරේන්තු ලැබූ නියෝජ්‍ය අමාත්‍ය නිශාන්ත මුතුහෙට්ටිගම මහතා 26 දා අලුයම විදේශ ගතව තිබේ.

ඒ පිළිබඳ පොලිස් මාධ්‍ය ප්‍රකාශක ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී අජිත් රෝහණ මහතා තහවුරු කළේ ය.

නියෝජ්‍ය අමාත්‍යවරයා එය සිදුකර ඇත්තේ දැඩි ආරක්ෂක රැකවරණ හා පොලිස් ආරක්ෂාව ද යොදා ඇති කටුනායක ජාත්‍යන්තර ගුවන්තොටුපොළ හරහා ය.

මේ පිළිබඳ පොලිස් මාධ්‍ය ප්‍රකාශක ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී අජිත් රෝහණ මහතාගෙන් කළ විමසුමකදී ඔහු කියා සිටියේ, නියෝජ්‍ය අමාත්‍ය නිශාන්ත මුතුහෙට්ටිගම මහතා ප්‍රභූ පර්යන්තයෙන් පිටත්ව යාම නිසා අත්අඩංගුවට ගැනීමට නොහැකි වූ බව ය.

# කොමියුනිස්ට් පක්ෂයෙත් පලුවක් ගැලවෙයි

ශ්‍රී ලංකාවේ කොමියුනිස්ට් පක්ෂයේ ලේකම් ඇමැති ඩිව් ගුණසේකර මෙම ජනාධිපතිවරණයේදි මහින්ද රාජපක්ෂ ජනාධිපතිවරයාට සහායෝගය දක්වීමට තීරණය කිරීමට විරෝධය පලකරමින් එම පක්ෂයේ මධ්‍යම කාරක සභාව නියෝජනය කරන ජ්‍යෙෂ්ඨයන් 21 දෙනෙක් විකල්ප කණ්ඩායමක් පිහිටුවා ගනිමින් පොදු අපේක්ෂක මෛත්‍රීපාල සිරිසේනට සහාය දක්වීමට ඉදිරිපත් වී සිටිති. ඉකුත් සතියේ මාධ්‍ය හමුවක් පවත්වමින් එම කණ්ඩායම කියා සිටියේ පක්ෂ නායකත්වයේ රාජ්‍ය ගැති ස්වාභාවය හේතුවෙන් මේ වන විට කොමියුනිස්ට් පක්ෂය කියා එකක් තිබෙනවාද යන්න පවා ජනතාවට අමතකව ගොස් ඇති බවයි.

ජනාධිපති ධුරයට තරඟ කිරීමට පනවා තිබූ සීමා ඉවත් කෙරුණු 18 වන සංශෝධනයට පක්ෂව ඡන්දය දීමට ක්‍රියා කළ පක්ෂ නායකයා පසුව ඒ පිළිබඳ ස්වයං විවේචනයක් ද සිදුකළ නමුත් නැවතත් මෙවර ජනාධිපතිවරයාට සහාය පලකරමින් ප්‍රතිපත්ති විරහිත ලෙස කටයුතු කරන බව කොමියුනිස්ට් පක්ෂයේ දේශපාලන මණ්ඩල සභිකයකු මෙන්ම ලංකා වෘත්තීය සමිති සම්මේලනයේ ලේකම් ඩී.එන්.ඒ. සුබසිංහ එහිදී ප්‍රකාශ කළේය. එබැවින් පක්ෂ විනය කඩකරමින් වුවත් පන්ති යුතුකම ඉටු කරනු වස් මේ ජනාධිපතිවරණයේදී විපක්ෂයේ පොදු අපේක්ෂකයාට සහාය දක්වන බවද හෙතෙම පැවසුවේය.

හේමා විල්බට්, රාජා උස්වැටකෙයියාව, උදේණි දිසානායක ඇතුළු කොමියුනිස්ට් පක්ෂයේ විකල්ප කණ්ඩායමේ සාමාජිකයන් පිරිසක් මේ අවස්ථාවට එක්ව සිටියහ.

# සමෘද්ධියේ අර්ථ සාධකයටත් කෙළින්න යයි

සමෘද්ධි සේවකයන් දිවි නැගුම දෙපාර්තමේන්තුවට අන්තර්ග්‍රහණය කිරීමේදී එතෙක් ඔවුන් වෙනුවෙන් එකතු වී තිබූ සේවක අර්ථ සාධක අරමුදල සේවකයන්ට නොදී මහා භාණ්ඩාගරය වෙත හරවා ගැනීමට ආණ්ඩුව උත්සාහ දරන බව වාර්තා වේ. මෙලෙස හරවා ගන්නට උත්සාහ දරන්නේ සමෘද්ධි සේවකයන් 25 000කට සේවා යෝජකයාගේ දායකත්වය ලෙස ලැබිය යුතුව ඇති 12%ක මුදල් ප්‍රමාණයයි.

මෙලෙස එක් අයෙකු වෙනුවෙන් එකතු වී ඇති මුදල් ප්‍රමාණය රුපියල් ලක්ෂ 10ත් 12 අතර වන බවත් සමස්ත සේවකයන් සැළකිල්ලට ගත් කළ එම මුදලේ මුළු වටිනාකම රුපියල් මිලියන 12 000ක් පමණ වන බවත් දැන ගන්නට ඇත.

# තොට එකක් මට එකක් දෙකක් බෑ

අග්‍රාමාත්‍ය සම්බන්ධීකරණ ලේකම්වරයකු වන පී ඩී නුගලියද්ද ඉකුත් 24 වෙනිදා පොදු අපේක්ෂකයාගේ මැතිවරණ ව්‍යාපාරයට එක් විය. එක්සත් ජාතික පක්ෂ මන්ත්‍රී ලක්ෂ්මන් කිරිඇල්ලගේ නිවෙසේ පැවැති මාධ්‍ය හමුවකදී ඒ පිළිබඳ අදහස් දක්වමින් හෙතෙම කියා සිටියේ 2009 වසරේ සිටි අගමැතිවරයාගේ සම්බන්ධීකරණ ලේකම්වරයා ලෙස කටයුතු කළ තමන් පොදු අපේක්ෂකයාට සහාය දක්වන්නට ඉදිරිපත් වන බව දැනගෙන පෙරදා අග්‍රාමාත්‍ය කාර්යාලයෙන් සහ ජනාධිපති කාර්යාලයෙන් බලපෑම් එල්ල වුණු බවය. හම්බන්තොටට එක් නීතියකුත් මහනුවරට තවත් නීතියකුත් ක්‍රියාත්මක වෙන තත්ත්වයක් රටේ පැවතීමට විරෝධය පලකිරීමක් ලෙස පොදු අපේක්ෂකයාට සහාය දක්වීමට තීරණය කළ බවද හෙතෙම පැවසුවේය.

# බොබසේ සහාය ජනපතිට

බොදු බල සේනා සංවිධානයේ පූර්ණ සහාය මහින්ද රාජපක්ෂ ජනාධිපතිවරයාට ලබා දෙන බව එහි මහ ලේකම් ගලගොඩඅත්තේ ඥානසාර භික්ෂුව 24වෙනිදා පැවැති මාධ්‍ය හමුවකදී ප්‍රකාශ කළේය.

මෙරට සිංහලයන්ට සහ බෞද්ධයන්ට ප්‍රශ්න රාශියක් ඇති බවත් හෙළ උරුමයේ පාඨලී චම්පික රණවක හෝ වෙනත් කිසියම් පාර්ශ්වයක් මෙතෙක් ඒවා විසඳීමට කිසිවක්ම කර නොමැති බවත් ඥානසාර භික්ෂුව ප්‍රකාශ කළේය.



ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂගේ මෙහෙයවීමෙන් ක්‍රියාත්මක වන අන්තවාදී සංවිධානයක් වන බොදු බල සේනාව පසුගිය කාලයේ දකුණේ මුස්ලිම් ප්‍රජාව ඉලක්ක කරගනිමින් ජාතිවාදී ප්‍රහාර දියත් කළ සංවිධානයයි. හලාල් ලාංඡනය යෙදීමට විරෝධය දක්වමින් ඇරඹි බොදු බල සේනා සංවිධානයේ මුස්ලිම් විරෝධී ප්‍රහාර බේරුවල සහ අලුත්ගම ප්‍රහාර දක්වා පැතිරුණු අතර ජනාධිපතිවරණය කැඳවීමට ආසන්න වෙද්දී එම සංවිධානය කිසියම් නිහඬ පිළිවෙතක් අනුගමනය කළේය.

# ලංකාවේ ප්‍රජාතන්ත්‍රවාදය නොනැසී පැවතීමට ආණ්ඩු වෙනසක් අත්‍යවශ්‍යය

**මහාචාර්ය ජයදේව උයන්ගොඩ**
**කොළඹ විශ්වවිද්‍යාලය**

ජනාධිපතිවරණයට ඇත්තේ තව සති දෙකකි. රට පුරා පවතින සීත හා වැසි සහිත කාලගුණය නොතකා ජනපතිවරණ සටන උණුසුම් වී ඇත. ඡන්ද දිනය ආසන්න වන විට එය තවත් රත් විය හැකිය. ආණ්ඩුව පැත්තෙන් බලන විට මෙය පරාජය වීමට නොහැකි ජනාධිපතිවරණයකි. මක්නිසාද යත් නැතිවෙන්නට බොහෝ දේ ආණ්ඩුවේ නායකයින්ට තිබෙන බැවිනි. ජනපතිවරණයෙන් ජය නොගෙන සිටීමට විපක්ෂ සන්ධානයට ද නොහැකිය. මන්ද යත් ජනාධිපති මහින්ද රාජපක්ෂ සහ ඔහුගේ ආණ්ඩුව පරාජය කිරීමට පෙර නොවූ විරූ අවශ්‍යතාවයක් මෙන්ම අවකාශයක් ද ඇති වී තිබීමය.

දෙපාර්ශ්වයෙන්ම බලන විට පරදුවට තබා ඇති දේ අති විශාලය.

මේ අතර මේ වන විට ඉදිරියට ගොස් ඇති ජනපතිවරණ ව්‍යාපාරය දෙස බලන විට පෙනෙන්නට තිබෙන දෙයක් නම් මහජන පරිකල්පනය ග්‍රහණය කොට ගැනීම සඳහා වූ තරගයෙන් මෛත්‍රීපාල සිරිසේන හා විපක්ෂ කඳවුර ඉදිරියෙන් සිටින බවයි. "දේශපාලන වෙනසක් සඳහා ආණ්ඩු වෙනසක්" යන විරුද්ධ පක්ෂ සන්ධානයේ ප්‍රධාන තේමාවට පුළුල් හා සාධනීය මහජන ප්‍රතිචාරයක් ලැබී තිබෙන බව පහැදිලිය. ජනාධිපති රාජපක්ෂගේ මැතිවරණ කඳවුරේ තිබෙන ප්‍රධාන දුර්වලකම ලෙස පෙනෙන්නේ එයට අලුත් දේශපාලන අදහස් නැති වීමයි. එම ප්‍රචාරක ව්‍යාපාරයේ ඇත්තේ පැරණි හා මහජනයාගේ දේශපාලන පරිකල්පනයට ආමන්ත්‍රණය කළ නොහැකි සටන් පාඨයි. ශක්තිමත් රාජ්‍යය, සංවර්ධනය ඉදිරියට ගෙන යෑම, දේශපාලන ස්ථාවරත්වය සහ ජනාධිපතිතුමාට කළ ගුණ සැලකීම යන මේවා ප්‍රයෝජනවත් අදහස්ය. එහෙත් ඒවා මහජනයාගේ දේශපාලන විඥානයට ආයාචනා කරන ඒවා නොවේ. රටේ ජනතාවගේ දේශපාලන පරිකල්පනය පුබුදුවන්නට රාජපක්ෂ මහතාට හා එතුමාගේ ප්‍රචාරක-මාධ්‍ය යාන්ත්‍රණයට තව දුරටත් නොහැකි බව පෙනේ.



ආණ්ඩුවේ මැතිවරණ ප්‍රචාරක ව්‍යාපාරය එක්තරා අර්බුදයකට මුහුණ පා ඇති බව දැන් පෙනේ. එය එක්සත් ජනතා සන්ධානයේ අභ්‍යන්තර කැඩී බිඳීයාමේ ක්‍රියාවලියට ද සමාන්තරවය. මෙම ද්විත්ව අර්බුදයට ආණ්ඩුව මුහුණ දෙන්නේ ජනපතිවරණ ප්‍රචණ්ඩත්වයේ පිළිසරණ පැතීමෙන් බව ද දැන් පැහැදිලි වේ. ආණ්ඩුව මෙම දිසාවෙහිම ඉදිරි සති දෙකෙහි දී ද ගමන් කරන්නේ නම් මහින්ද රාජපක්ෂ මහතාගේ ජනපතිවරණ ව්‍යාපාරය මෛත්‍රීපාල සිරිසේන මහතාගේ ව්‍යාපාරයට ආධාර කරන එකක් වීම වැලැක් විය නොහැකි වනු ඇත.

"මහජන පරිකල්පනය දිනා ගැනීම" සඳහා වූ සටනේ දී මෛත්‍රීපාල කඳවුරට වාසි වන ප්‍රධාන කරුණ වී තිබෙන්නේ "වෙනසක් අවශ්‍යයි" යන අදහසට පොදු ජනයා ද ඇතුළු මහජන දේශපාලන විඥානයේ ගැඹුරටම කිඳා බැසීමට හැකි වීමයි. "වෙනසක් ඕනෑ නේද?" සහ "මේ ගොල්ලෝ හිටිය කල් හොඳටම ඇති" යන ප්‍රකාශ දෙක "වෙනසක් සඳහා" වූ මෙම මහජන දේශපාලන අභිලාෂය ඉතා ප්‍රබලව ප්‍රකාශ වන ඒවාය. එම "වෙනස" යන්නෙහි කාරණා දෙකක් අඩංගු වන බව ද පෙනේ. පළමුවැන්න මුහුණුවල වෙනසකි. දෙවැන්න ආණ්ඩුකරණ ශෛලියේ වෙනසකි. මූලික ප්‍රතිපත්ති සම්බන්ධයෙන් ප්‍රධාන කඳවුරු දෙකෙහිම බරපතල වෙනසක් නොමැති බව මහජනයා දනිති.

"ආණ්ඩු වෙනසක්" යන අදහස 'අලුත් ආණ්ඩුවක් අවශ්‍යයි' යන්න දක්වා දැන් පරිවර්තනය වී ඇති බව ද මැතිවරණ ව්‍යාපාරය දෙස බලන විට පෙනේ.

ජනවාරි 8 වන දා ජනපතිවරණයෙන් කවුරු ජය ගනීදැයි තවමත් ස්ථිරවම කිව නොහැකිය. දැනට තිබෙන ප්‍රවණතාවයන්ගෙන් පෙනෙන්නේ මෛත්‍රීපාල සිරිසේන මහතාට ජයග්‍රහණයේ නැඹුරුව වඩා වාසිදායකව තිබෙන බවයි. ඒ බව ආණ්ඩුවත් දනී. තම ජනපතිවරණ ව්‍යාපාරය වෙනස් කිරීමට, අලුත් කිරීමට හා නව ජීවනයක් දීමට මහින්ද රාජපක්ෂ මහතාට හැකි වේ ද යන්න ප්‍රශ්නයකි. මෙම ජනාධිපතිවරණයේ කේන්ද්‍රීය තරගය පවතින්නේ "වෙනසක් ද? අඛණ්ඩව තවදුරටත් සිටීම ද?" යන ප්‍රශ්නයයි. මෙහි දී මගේ ඡන්දය ලැබෙන්නේ "වෙනසක්" යන අදහසටය. එයට ප්‍රධාන හේතුව නම් ලංකාවේ ප්‍රජාතන්ත්‍රවාදය නොනැසී පැවතීමට ආණ්ඩු වෙනසක් අත්‍යවශ්‍ය වීමයි.

මහින්ද රාජපක්ෂ මහතාගේ දෙවැනි ධුර කාලයේ දී ලංකාවේ ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රියාවලිය බරපතල පසුබෑමකට ලක් විය. එය නම් ජනාධිපති, රෙජීමය සහ රාජ්‍යය යන එකිනෙකට වෙනස් බල ආයතන තුන ජනාධිපතිවරයා සමග සාකල්‍යයෙන්ම අනන්‍ය වීමයි. ජේ ආර් ජයවර්ධන මහතා 1978 දී ආරම්භ කළ එම ක්‍රියාවලිය 1993-2009 කාලය තුළ දී ඇණහිට තිබිණි. එහෙත් 2010 දී සම්මත වූ 18 වන සංශෝධනයෙන් පසුව සිදු වූයේ එම ක්‍රියාවලිය කූටප්‍රාප්ත වීමයි. මේ ක්‍රියාවලිය නැවැත්වීම හා ආපසු හැරවීම ලංකාවේ ප්‍රජාතන්ත්‍රවාදයේ අනාගත චිරස්ථිතිය සඳහා අනිවාර්ය පූර්ව කොන්දේසියකි. අලුත් ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රියාවලියක, ජනාධිපති, ආණ්ඩුව හා රජ්‍යය යනු එක් පුද්ගලයෙකු නොව ආයතන තුනක් බවට පත් කළ යුතුව තිබේ. මෛත්‍රීපාල සිරිසේන මහතාගේ ජනපතිවරණ ව්‍යාපාරයේ ඇති ඉතාම වැදගත් විභවය හෙවත් ශක්‍යතාවය මෙයයි.

ජනවාරි 08 වෙනි දා "ආණ්ඩු වෙනසක්" සඳහා මා ඡන්දය දෙන්නේ ඒ නිසාය. ලංකාවේ ඡන්ද දායකයින්ගෙන් වැඩි දෙනා ද මේ අදහසම දරනු ඇතැයි මම අපේක්ෂා කරමි.

## කොළඹ කොළම

## කුමරු එනකන්

**උපාලි කොළඹගේ**

අද විධායක ජනාධිපති ධුරයේ බලය දරමින් සිටින මහින්ද රාජපක්ෂ මම දකින්නේ අර්ධ ඒකාධිපතියෙකු ලෙසිනි. යම් හෙයකින් ඔහු තෙවෙනි වරටත් ජනාධිපති ධුරයට පත්වුව හොත් පූර්ණ ඒකාධිපතියෙකු වනවා නොඅනුමානය.

මෛත්‍රීපාල සිරිසේන මහතා ආණ්ඩුවෙන් එළියට ආ නොබෝ දිනකින්ම ජනාධිපතිවරයා ප්‍රසිද්ධ රැස්වීමකදී ප්‍රකාශ කර සිටියේ ළඟින්ම සිටි පුද්ගලයා කටයුතු කළ ආකාරය අනුව විධායක බලය අත්හැරීමට තමා අකමැති බවය. ඔහු එම ප්‍රකාශය කළේ භික්ෂූන්වහන්සේලා පිරිසක්ද සහභාගි වූ රැස්වීමකදීය.

මේ අනුව ඔහු යම් විදිහකින් බලයට පත්වුවහොත් ඔහු තමන්ගේ සෙවනැල්ල හා සහෝදර සමාගම හැර කිසිවෙකුත් විශ්වාස නොකරන බවනම් ඒකාන්තය.

රාජපක්ෂ මහතා අනාගතයේදී කෙසේ හැසිරේවිද යන්න මැතිවරණය ආසන්නයේ දැන් ඔහු හැසිරෙන ආකාරයෙන්ම අපට සිතාගත හැකිය. දැන් මැතිවරණ වේදිකාවල පවා පෙනී සිටින්නේ ඉස්සර මහින්ද රාජපක්ෂ නොවේ. ඉස්සර මහින්ද රාජපක්ෂ සොඳුරු ආඥාදායකයෙක් විය හැකියි. මා හිතන්නේ සහෝදර සමාගම හැර වෙනත් කිසිවෙකුවත් මහින්ද විශ්වාස කරන්නේද නැත.

පසුගිය කාලයේ හොඳටම කලකිරීමෙන් කතා කළ නිමල් සිරිපාල සහ දිනේෂ් ගුණවර්ධන ඇමැතිවරුන් දැන් ඉදිරියට දමා යම් යම් අදහස් ප්‍රකාශ කරවනු දැකගත හැකිය. මේ වෙනසට හේතුව මහින්ද රාජපක්ෂ මේ අයටත් අගමැති කැරට් අලය පෙන්වීම විය හැකියි. එස්.බී.ට හා සුසිල් ප්‍රේමජයන්තටත් අගමැති කැරට් අලය පෙන්වා ඇති බව විශ්වාසය. ඒ සියළු දෙනාට කැරට් අලය පෙන්වූවාට ඔහු ඒ කිසිවෙකුටත් අගමැති තනතුර නොදෙයි. අගමැති තනතුර සඳහා ඔහු තෝරාගනු ඇත්තේ ජ්‍යෙෂ්ඨ ඇමැතිවරුන් අතර සිටින වයෝවෘද්ධම පුද්ගලයා මිස අන් කෙනෙක් නොවේ. ඒ තමන්ගේ පුත් කුමාරයා නිසි වයසට පැමිණෙන තෙක් කල් මැරීමක් ලෙසිනි.

ඇත්ත වශයෙන්ම දින සීයක් නොව දෙසීයකින් හෝ විධායක බලතල ඉවත් කිරීම, ස්වාධීන කොමිසන් පත් කිරීම හා තොරතුරු දැනගැනීමේ අයිතිය, මැතිවරණ ක්‍රමය වෙනස් කිරීම යන කරුණු කීපය පමණක් මෛත්‍රීපාල සිරිසේන මහතාගෙන් ඉටු වුවද ඒ හොඳටම ප්‍රමාණවත්ය. මහින්ද රාජපක්ෂ මහතා බලයෙන් ඉවත් කිරීම යුගයේ අවශ්‍යතාවයක් බවට පත්වන්නේ මේ කරුණු හේතුවෙනි.



ඉදිරිය

ඉදිරිය පුවත්පත
3/181, ශ්‍රී ජිනවංශ නාහිමි පෙදෙස,
උතුරු කදිරාන, මීගමුව.
කර්තෘ - 071 8287897
Email : idiriyanews@gmail.com

# නව ආරම්භයක් සඳහා

ජනපතිවරණය සඳහා ඇත්තේ තවත් දින දොළසකි. ඡන්දය ප්‍රකාශ කිරීමේ කාර්යය දැනටම ඇරඹී ඇත. මෙරට කලක් තිස්සේ වර්ධනය වෙමින් තිබූ දුර්දාන්ත පාලනය ඉවත් කොට නව මාර්ග යකට යොමු වීමේ අවස්ථාව ජනතාවට ලැබී ඇත. නිවැරදි තීරණයක් ගෙන රට වැටී ඇති අගාධයෙන් ගොඩ ගැනීම සඳහා සාධනීය ආරම්භයකට ජනතාව තීරණය කොට ඇති බවට හැම පැත්තකින්ම සංඥා ලැබෙමින් පවතී.

එක් අතකින් බහුතර ජනතාව පොදු අපේක්ෂකයා කෙරෙහි දිනෙන් දින වඩ වඩා ආකර්ෂණය වන ආකාරය පෙනේ. කලකට පෙර සිටම කටයුතු ආරම්භ කොට තිබූ වර්තමාන ජනාධිපතිවරයාගේ ප්‍රචාරක ව්‍යාපාරය එහි උච්ඡ අවස්ථාව ද පසු කොට අව පක්ෂයේ ගමනක් අරඹා ඇත. එසේම එම ව්‍යාපාරයේ උපක්‍රම එයටම අවාසි සහ ගත තත්වයකට දැනටම පත්ව ඇත. උදාහරණයක් වශයෙන් රට පුරා පහන් කණු, දුරකථන රැහැන් කණු හා සුදුසු නුසුදුසු හැම තැනකම ප්‍රදර්ශනය වූ විවිධ ප්‍රමාණයේ පින්තූර නිසාම රජයේ අපේක්ෂකයා ජනතාවගේ හාස්‍යයට ලක් වී ඇත. එමෙන්ම ආරක්ෂක හමුදාවන්හි ආරක්ෂාව ද ලබා දෙමින් මැර කණ්ඩායම්ලවා දියත් කෙනාට ඇති භීෂණය ද පාරා වළල්ලක් වී ඇත.

එක්තරා දේශපාලන විද්‍යාඥයෙකුගේ නිරීක්ෂණය අනුව රජයේ ප්‍රචාරක ව්‍යාපාරයෙන් වාසි ලැබෙන්නේ පොදු අපේක්ෂකයාටය.

අනෙක් අතට රජයට සහාය දක්වමින් සිටි පක්ෂ අතුරින් සමහර ඒවා සම්පූර්ණයෙන් ද තවත් සමහර පක්ෂවල බහුතරය, විශේෂයෙන් කම්කරු පංති නායකයින්ද ප්‍රසිද්ධියේම පොදු අපේක්ෂකයාට සහාය දීමට ඉදිරිපත් වී ඇත. රජය හා විපක්ෂයේ පක්ෂවලින් පිල් මාරු කළවුන් සන්සන්දනය කොට බලන විට ද රජයට එක් වී ඇති පිරිස ජන පදනම හා කීර්තිය අතින් ඉතා පහළ තත්වයක සිටින පුද්ගලයින් පිරිසකි. මේ පිරිස් අතර ඇති වෙනස ද රජයට අත් කොට දී ඇත්තේ අපකීර්තියකි.

රජය විපක්ෂයේ පුද්ගලයන් ආකර්ෂණය කොට ගැනීමට හා රජයෙන් ඉවත් වීමට තැත්කරන්නවුන් නවතා ගැනීමට ද වැය කරන මුදල් සම්භාරය පිළිබඳ ප්‍රචාරය වන තොරතුරු විසින් ද රජයේ නායකයින්ට එරෙහි දූෂණ චෝදනාවන් තව දුරටත් පෝෂණය කරනු ලැබ ඇත.

ජනපතිවරණය ආසන්න වත්ම රජයේ හා සංස්ථා නිලධාරින් හා සේවකයන් කෙරෙහි ඇමතිවරුන්ද ඇතුළු නායකයින්ගේ අධිකාරය හීන වන්නට පටන් ගෙන තිබීම ඔවුන් විසින් ද ජනපතිවරයාගේ පරාජය පිළි ගනු ලැබීම පිළිබඳ නවතම සංඥාවයි.

රජයේ ඒකාධිපති හා දූෂිත ක්‍රියාවන්ට අකමැති වුව ද බිය නිසා මෙතෙක් නිහඬව සිටි සමහර සංවිධාන හා පුද්ගලයින්, විශේෂයෙන්ම උගත් වෘත්තිකයින් ද මේ වන විට ප්‍රසිද්ධියේ සිය අදහස් ප්‍රකාශ කිරීම අරඹා ඇත.

මෙබඳු සංඥාවන්ගෙන් ද කියැවෙන්නේ වර්තමාන ජනාධිපතිවරයාට ඉදිරි ජනාධිපතිවරණයේ දී අත් වන පරාජය පිළිබඳ පණිවිඩයකි.

මේ තත්වය යටතේ එක් අතකින් ජනතාව නොබියව සිය මතය පළ කිරීමට ඉදිරිපත් විය යුතුව ඇත.

අනෙක් අතට පොදු අපේක්ෂකයාට සහාය දෙන පිරිස් වඩා සංවිධානාත්මකව තම ප්‍රචාරක ව්‍යාපාරය ව්‍යාප්ත කළ යුතුය. එමෙන්ම ප්‍රජාතන්ත්‍රවාදය යළි පිහිටුවීමට හා ප්‍රජාතන්ත්‍රවාදය ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය ආයතන පණ ගැන්වීමට උත්සුක විය යුතුය. වසර ගණනක් තිස්සේ ඒකාධිපතිපාලනයකනට අවනත වී බියෙන් සිටි පිරිසක් නැවත සිය ප්‍රජාතන්ත්‍රවාදී අයිතීන් ලබා ගනීමට මෙහෙයවීම මෙන්ම ප්‍රජාතන්ත්‍රවාදී පරිසරයක් තුළ සිය යුතුකම් හඳුනා ගැනීමට මෙන්ම ඒවා ඉටු කිරීමට යොමු කිරීම ද පහසු කාර්යයක් නොවේ. මේ සඳහා ස්වයං අධ්‍යයනයක් මෙන්ම විශේෂයෙන්ම අධිකාරිවාදී පරිසරයක් පමණක් අත් දකීමට සිදු වූ තරුණ පිරිස්වලට අවශ්‍ය උපදෙස් ලබා දීම ද අවශ්‍ය වේ. ඉතා කෙටියෙන් කිවහොත් පසු ගිය අවධිය තුළ ඉහළින් එන අණ පිළිපැදීමටත්, මර්ධනය ඉවසා සිටීමටත් ඇති කොට ගෙන තිබූ පුරුදුවලින් ඉවත් වී අපගේම ප්‍රාරම්භකත්වයට ප්‍රමුඛතාවය දීමට පුරුදු විය යුත්තෙමු.

එක් අතකින් තවත් වසර දෙකක් වර්තමාන පරිසරය තුළ අවිනිශ්චිතව සිටිමින් පීඩා විඳීම වෙනුවට නව ආරම්භයක් සඳහා අවස්ථාව ලැබීම පිළිබඳව අපි සතුටු විය යුත්තෙමු. එසේම මේ අවස්ථාවෙන් නිසි ප්‍රයෝජන ගනිමින් මෙම දුර්දාන්ත පාලනය වෙනස් කිරීමට නොහැකි වුවහොත් අප බොහෝ දෙනෙකුට ඉතිරි ජීවිත කාලයම වහලුන් සේ ජීවත් වීමට සිදු වන බව අවබෝධ කොට ගත යුත්තෙමු.

බොහෝ දෙනෙකු කියන අන්දමටම අප ඉදිරියේ ඇත්තේ හුදෙක් එක් පාලකයෙකු වෙනුවට අප වඩා කැමති පාලකයෙකු තෝරා ගැනීම පිළිබඳ සරල තීරණයක් නොවේ. මෙයා වෙනුවට එයා පත් කොට ගත්තත් වෙනසක් ඇති නොවන්නේයයි කියන නරුම අන්තවාදීහු ද සිටිති. එහෙත් අද අප ඉදිරියේ ඇත්තේ සියලු අපේක්ෂා බිඳ වැටී ඇති තත්වයකින් මිදී නිදහස්ව සිතිය හැකි හා නිදහස්ව කටයුතු කළ හැකි ප්‍රජාතන්ත්‍රවාදී අවකාශයක් බිහි කොට ගැනීමේ තීරණාත්මක අවස්ථාවයි. මෙය ජනාධිපතිවරණයෙන් අවසන් වන ගමනක් නොවේ. මෙය නව ගමනක ආරම්භයක් පමණි. ආරම්භයක් නොමැතිව ඉදිරි ගමනක් නැත. ඉදිරි මග කුමක්දැයි තීරණය කළ යුත්තේ ද අප විසින්මය.

# මහින්ද චින්තනය කඩවුණු පොරොන්දුවක්

රජීව විජේසිංහ



**ඔබේ අදහසේ හැටියට මේ අවස්ථාවෙ ලංකාවෙ ස්ථාවරත්වයක් ඇතැයි කිව හැකි ද?**

කිසි සේත්ම කිව නොහැකියි. රජය එල්ටීටීඊය දිරිමත් කිරීමට කටයුතු කැරන අතරම ප්‍රසිද්ධියේ කියන්නෙ රටට එල්ටීටීඊයෙන් බලවත් තර්ජනයක් ඇති බවයි.

රජයේ සහාය ලබමින් හෝ නොලබමින් ආගමික ප්‍රශ්න මුල් කොට ගෙන රට අස්ථාවර කිරීමේ ප්‍රයත්නයක් දියත් වී තිබෙන බව පැහැදිලි කරුණක්.

මහින්ද රාජපක්ෂ කියන්නෙ, රටට එරෙහි විදේශීය කුමන්ත්‍රණ තියනව කියලයි. ඒත් එයාගෙ සගයොම තමයි රටේ ගැටුම් නිර්මාණය කරන්නෙ.

ඒ වගේම ඒවා අස්ථාවරත්වය ඇති කිරීමේ ප්‍රයත්න සේ හඳුන්වමින් සාමකාමී විරෝධතා මැඩලීමටත් භීෂණය යොදා ගන්නව. මේක ඉතාම භයානක තත්වයක්.

**ඇත්තටම යුද්දේ දිනුවෙ කවුරුන් කියල ද ඔබ හිතන්නෙ? ඒ පිළිබඳව මහින්ද රාජපක්ෂට පමණක් ගෞරවය හිමි විය යුතුයි කියා ඔබ හිතනව ද?**

අවසාන සටනට නායකත්වය දීම පිළිබඳව මහින්දගෙ දායකත්වය වැදගත්. ඒ වගේම හමුදාව, ගුවන් හමුදාව, ආරක්ෂක අමාත්‍යාංශය, විදේශ කටයුතු අමාත්‍යාංශය, එක්සත් ජාතීන්ගෙ මණ්ඩලය, ඉන්දියාව වගේ රුටවල තානාපති සේවය වගේ විවිධ තැන්වල කාර්යක්ෂම හා සුදුසු පුද්ගලයන් හිටිය. ශවුන් ඒ තැන්වල සිටීම වැදගත්.

ඒත් යුද්දෙ දින්වට පස්සෙ තෝරා ගත් කීප දෙනෙක් අතට බලය කේන්ද්‍ර ගත කිරීමක් ජනාධිපතිවරයා සිදු කළා. එහි දි ඔහුගේ නෑ හිතවතුන්ටයි වගකීම් පැවරුවෙ. මේ තත්වය නිසා රට අපකීර්තියට

**අද විදේශ කටයුතු අමාත්‍යාංශය ආරක්ෂක අමාත්‍යශයේ යටත් විජිතයක්. ආරක්ෂක අමාත්‍යශය ඊශ්‍රායලයෙ යටත් විජිතයක්**

පත් වුණා. මේ පිළිබඳව ඔහු වග කිව යුතුයි.

**මහින්ද චින්තනය කඩවුණු පොරොන්දුවක්යයි ඔබ පිළිගන්නව ද?**

සම්පූර්ණයෙන්ම වගේ එය කඩ වුණු පොරොන්දුවක්. අපි කිව්වෙ හදිසි ජනපතිවරරණයකට නොගිහිං රටේ අධ්‍යාපනය, ජාතික ප්‍රශ්නය, මැතිවරණ ක්‍රමය වගේ අංශ පිළිබඳ ප්‍රශ්න විසඳල ඉන්න කියලයි. ඒත් කවර හෝ අද්භූත ගණන් බැලීමක් අනුව ජනාධිපතිවරණයට යාමට තීරණය කළා.

මේ තත්වය නිසා රජයේ ජ්‍යෙෂ්ඨ ඇමතිවරුන් ඇතුළු මන්ත්‍රීවරුනුත් ඉන්නෙ දැඩි කලකිරීමකින්. අන්තිමට සිද්ද වුණේ මහින්ද චින්තනය අතහැරල ඒ වෙනුවට වෙන පොරොන්දු මාලාවක් හදා ගැනීමයි.

**ලංකාවෙ අර්බුදකාරී විදේශ ප්‍රතිපත්තියට වග කිව යුත්තේ කවුරුන් කියලද ඔබ හිතන්නෙ?**

අවසාන වශයෙන් මේ සියල්ලට වග කිව යුත්තෙ ජනාධිපතිවරයා. සමහරු පෙන්වා දෙන අන්දමට අද විදේශ කටයුතු අමාත්‍යාංශය ආරක්ෂක අමාත්‍යශයේ යටත් විජිතයක්. ආරක්ෂක අමාත්‍යශය ඊශ්‍රායලයෙ යටත් විජිතයක්.

යමක් හිතන්න පුලුවන් බුද්ධිමත් අය විදේශ සේවයෙන් ඉවත් කරල. පිටින් ගත්ත නෑ හිතවතුන්ගෙන් විදේශ සේවය පුරවල.

# 'මගේ ආණ්ඩුව' පරදවා පිහිටුවන 'අපේ ආණ්ඩුවට'

එස්. රණතුංග



ඉදිරියට තවත් වසර දෙකක් ඉතිරිව තිබියදීත් ජනාධිපතිවරයා විසින්ම අකාලයේ කැඳවාගත් ජනාධිපතිවරණය ඉදිරියේ ඔහු විසින්ම මරාවේශයට පත් වී සිටී. පාලන බලය මාරු වීමේ මැතිවරණ තරගයකදී මේ රටේ මීට ප්‍රථම විසූ කිසිම රාජ්‍ය පාලකයෙකු මෙතරම් මාරාවේශ වූ කාලයක් අපට නම් මතක නැත. ඒ බලය අතහැර දැමීම තමනට අතිශය විනාශකාරී යැයි සිතීමට යම් පාලකයකුට අනුබල දෙන වාතාවරණය මෙරට වර්ධනය වී ඇති අශිෂ්ඨ දේශපාලන සංස්කෘතියේ ප්‍රකාශනයකි. විශේෂයෙන්ම 18 වන ව්‍යවස්ථා සංශෝධනය සම්මත කර ගැනීමෙන් පසුව බලය අතහැර යාමට කිසිම සූදානමක් නොමැති බව ප්‍රකාශයට පත් වී අවසන්ය. ඇත්තෙන්ම පවසතොත් ව්‍යවස්ථාවෙන් පැවරී ඇති බලතල වර්තමාන ජනාධිපතිවරයා විසින් අශීලාචාර අන්දමින් ක්‍රියාත්මක කිරීමේ තත්ත්වයක් තුළ විශේෂයෙන්ම රටේ රාජ්‍ය පාලන තන්ත්‍රය තුළත් පොදුවේ සෙසු ආයතන පද්ධතිය තුළත් අවරගණයේ දේශපාලන සංස්කෘතියක් වර්ධනය වී තිබේ. විධායක ජනාධිපති ක්‍රමය ලංකා ආණ්ඩුක්‍රමය තුළින් ව්‍යවස්ථාමය වශයෙන් අක්‍රිය කොට ඉවත් කළ ද පිළිකාවක් මෙන් ලියලා වැඩී ඇති මෙම අවර ගණයේ දේශපාලන සංස්කෘතික ජන ජීවිතය තුළින් ඉවත් කිරීම ලෙහෙසි පහසු කටයුත්තක් නොවේ.

එහෙත් අවධාරණය කළ යුතු තවත් යමක් තිබේ. රටක ඉදිරි ගමනට කෙසේවත් යහපත් නොවන මෙම දේශපාලන සංස්කෘතික ලක්ෂණ ප්‍රථම වතාවට ලංකාවේ විද්‍යමාන වූයේ විධායක ජනාධිපති ක්‍රමයක් 1978 ව්‍යවස්ථාව තුළින් ආරම්භ වීමත් සමඟ යැයි පවසතොත් එය සත්‍යයක් නොවේ. මෙම ලක්ෂණ ජන ජීවිතයට ප්‍රබල අන්දමින් කා නොවැදී පාලනය කළ හැකි අන්දමින් සෑම පාලන සමයකම පැවති ඒවා විය. එමෙන්ම රාජ්‍ය පාලනය තුළින් අනුබලයක් නොලැබූ මෙන්ම ජන ජීවිතය තුළ එතරම් පිළිගැනීමකට ද ලක්වූ ඒවා නොවිය. නමුත් වර්තමාන ජනාධිපතිවරයා යටතේ මෙම ලක්ෂණ ඉතා වේගයෙන් වර්ධනය වූ අතර, රාජානුග්‍රහය නොමඳව ලබමින් නිර්බාධකව ක්‍රියාත්මක වෙමින් සාමාන්‍ය ජන ජීවිතය තුළට සීඝ්‍රයෙන් කා වැදෙන්නට විය. මෙම තත්ත්වයට සමාජයේ දැනුවත් සිවිල් සමාජය විසින් විරෝධයක් නොදැක්වූයේ නොවේ. මෙවර ජනාධිපතිවරණය ප්‍රකාශයට පත් වීමත් සමඟ වේගයෙන් කරළියට පැමිණියේ එම විරෝධයයි.

ප්‍රස්තුත අවරගණයේ දේශපාලන සංස්කෘතිය තුළ කැපී පෙනෙන ප්‍රධාන ලක්ෂණ කිහිපයක් සඳහන් කිරීම මෙහිදී වැදගත් කොට සලකමි.

1. නීතිය තුට්ටුවකටවත් මායිම් නොකිරීම සහ ව්‍යවස්ථාපිත නීතියට ඇතුළත් නොමැති එහෙත් සමාජ සංස්ථාව ආරක්ෂා කළ තුලනයන් හා වරණයන් බල රහිත තත්ත්වයකට ඇද දැමීම පළමු වැන්නය. ලිහිල් සිංහල භාෂාවෙන් පවසතොත් වැරදි කිරීමට ඇති 'ලජ්ජාව සහ බය' මේ රටේ ජනතාවගේ සිත් සතන් තුළින් ඉවත් කිරීමය. නීතිය ඉදිරියේ සියල්ලන්ම සමානයයි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සඳහන් වුව ද දේශපාලන බලය අතැති පුද්ගලයා එවන් බලයක් නොමැති පුද්ගලයා ඉදිරියේ සමාන නොවන බව මෙම පාලනය යටතේ කොතෙකුත් ඔප්පු වී තිබේ. නීතිය සුරකීමට නිල වශයෙන්ම බලය පැවරී ඇති ආයතන පද්ධතිය තුළට ද අතීතයේ විෂ බීජය හෙවත් ලජ්ජා බය නැතිකම සීඝ්‍රයෙන් කාන්දු වී එම ආයතන ද කුණු වී ඕජස් ගලන තත්ත්වයට පත් වී ඇත.

2. රටේ ව්‍යවස්ථාදායක බලය හිමි පාර්ලිමේන්තුවත් විධායක බලය හිමි කැබිනට් මණ්ඩලයේත් බලාධිකාරිය ඉක්මවා ඒ ආයතන දෙක අනියම් ආකාරයකට ජනාධිපතිවරයාගේ රබර් මුද්‍රා බවට පත්කරගෙන තිබේ. රටේ මූල්‍ය පාලනය ක්‍රමයෙන් පාර්ලිමේන්තුවෙන් ගිලිහී ගොස් ඇති අතර එය අද ජනාධිපතිවරයාගේ සෘජු පාලනයට නතු වී තිබේ. රටේ මූල්‍ය විනය දිරාපත් වී ආයතන මට්ටමේ වංචා දූෂණ, එමගින් රටකට ඉසිලිය නොහැකි මට්ටමකට ගමන් කරමින් ඇත. ඇමැතිවරු ඇත්තේ නාමිකවය. ඇමැතිවරයාගේ විෂය පථය ආක්‍රමණය කිරීමට පාලක පවුලේ ඕනෑම සාමාජිකයෙකුට සිය අභිමතය පරිදි සිදු කිරීමට අවශ්‍ය වාතාවරණය මෙම පාදඩ දේශපාලන සංස්කෘතිය තුළ ගොඩනගා ඇත. ඇමැතිවරයාගේ විෂය පථයට සම්බන්ධ මොනයම්ම හෝ ගැටළුවකට අවසාන විසඳුම ලැබෙන්නේ ජනාධිපති අතිනි. කැමැත්තෙන් හෝ අකමැත්තෙන් එම විසඳුම විඳ දරා ගැනීමට ඇමැතිවරයා සූදානම්ව සිටිය යුතුය.

රටේ මූල්‍ය විනය දිරාපත් වී ආයතන මට්ටමේ වංචා දූෂණ, එමගින් රටකට ඉසිලිය නොහැකි මට්ටමකට ගමන් කරමින් ඇත. ඇමැතිවරු ඇත්තේ නාමිකවය. ඇමැතිවරයාගේ විෂය පථය ආක්‍රමණය කිරීමට පාලක පවුලේ ඕනෑම සාමාජිකයෙකුට සිය අභිමතය පරිදි සිදු කිරීමට අවශ්‍ය වාතාවරණය මෙම පාදඩ දේශපාලන සංස්කෘතිය තුළ ගොඩනගා ඇත.

3. රාජ්‍ය හෝ අර්ධ රාජ්‍ය ආයතනයකට හෝ මහජන මුදලින් ලැබෙන වත්කම් මෙන්ම එම වත්කම් ලැබෙන සහ ප්‍රයෝජනයට ගන්නා ආකාරය දැන ගැනීමේ ශුද්ධ වූ අයිතිය මහජනයා සතුය. මේ රටේ රාජාණ්ඩු පැවැති යුගවලදී පවා මෙම අයිතියට ගරු කිරීමේ සම්ප්‍රදායක් පැවති බවට මිහින්තලා සෙල්ලිපිය ද සාක්ෂි දරයි. එහෙත් වර්තමාන පාලනය යටතේ ජනතාවගේ බදු මුදලින් නඩත්තුවන ආයතනවල මෙන්ම බිලියන ගණනින් විදේශ ණය යොදා සිදුකරන යටිතල ව්‍යාපෘතිවල ද වියහියදම් මහජනතාවට සඟවා ලීමේ ප්‍රතිපත්තියක් වර්ධනය වී ඇති අයුරු දක්නට ලැබේ. අද මෙය සාමාන්‍ය තත්ත්වයක් ලෙස මහජනයා විසින් ද සලකන බවක් පෙනේ. නිමකර ඇති කාර්යයේ සෝබාවෙන් දැස් අන්ධවන මෙරට ජනයාට එම කාර්යය පිටුපස ඇති මහා ධන කොල්ලය පිළිබඳව හාහුවක් නොදැනේ. එබැවින් මේ ගත වනුයේ ආණ්ඩුවේ ඉහළම ස්ථරයේ ගජ මිතුරන්ගේ බිලියන ගණනින් මඩි තර කර ගැනීමේ හෝරාවයි.

4. නොපෙනෙන බලවේගවලට සිය ජීවිතයේ භෞතික ප්‍රශ්න විසඳීමට භාර කිරීමේ පරාධීන විඥ්ඥාණය පාලක පැලැන්තියේ සිට ජනතාවගේ පහළම මට්ටමේ පාලිතයන් දක්වා බෝවී ඇති අයුරක් දක්නට ලැබේ. රාජ්‍ය නායකයා මිථ්‍යාවේ කරවටක් ගිලී සිටින්නෙකි. සිය බලාධිපතිත්වය ආරක්ෂා කර ගැනීමට පිහිට වෙතැයි සිතෙන ලංකාවේ පිහිටි සියලුම දේවාල කෝවිල්වල පුද පූජා පවත්වා අන්තිමේදී ඉන්දියානේ තරුපති කෝවිලේ, ඉන්දියාවේ අන්ද්‍රා ප්‍රදේශයේ පිහිටි වෙන්කතේශ්වර කෝවිලේ රාජකීය බැතිමතෙක් වී සිටී. (මෙවර ජනාධිපතිවරයාව කැඳවාගෙන යන ලද්දේ කොළඹ හිල්ටන් හෝටලයේ අධිපති තිරු නඩේසන්ය). මැතිවරණ දිනය ඇතුළු දේශපාලනයට අදාළ සියලුම නැකත් දිනයන් සකස් කර දීමට රාජකීය දෛවඥයෙක් ඔහුට සිටී. මෙතෙක් මේ රට පාලනය කළ සියලුම පාලකයන්ට වඩා මහින්ද රාජපක්ෂ ජනාධිපතිවරයා රටේ සියලුම විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍ය හරහා රටපුරා මිත්‍යාව බෙදා දෙයි. තමාගේ පෞද්ගලික ඇදහීම් විශ්වාසය කෙනෙකුට කොතෙක් තිබිය හැකි වුව ද ඒවා ප්‍රසිද්ධ මාධ්‍ය හරහා ප්‍රදර්ශනය කළ සංස්කෘතියක් මෙතෙක් මෙරට නොවිය. ඒ අනුව තම තමන්ගේ එදිනෙදා ජීවිතයේ ගැටළු විසඳා ගැනීමට නොපෙනෙන බලවේග දෙසට නැඹුරු වීමට රටේ නායකයාව අනුගමනය කරන බොහෝ පිරිස් නැඹුරුවක් දක්වති. වර්තමාන විධායක ජනාධිපතිවරයාගේ පාලන සමය තුළ වර්ධනය වෙමින් පවතින මෙකී අවරගණයේ දේශපාලන සංස්කෘතියේ හානිය ව්‍යවස්ථාමය වෙනසක් පමණක් අවම කිරීම පහසු කටයුත්තක් නොවන නමුදු අලුතෙන් බලයට පත් වීමට අපේක්ෂා කරන දේශපාලන කණ්ඩායම තුළ ඒ සඳහා දෘෂ්ටිමය සූදානමක් පැවතීම අවශ්‍ය බව ප්‍රකාශ කර සිටිමු.

# සබුද්ධික ජනතාව අනාගතය කලින් දකිනවා

## ඩබ්.ඒ. අබේසිංහ



මේතරම් තීරණාත්මක මැතිවරණයක් මීට කලින් පැවැත්විලා නෑ. අපේ සියලු දේවල් රැකගැනීම සඳහා ලැබී ඇති අන්තිම අවස්ථාව මෙයයි. එය මගහැරීමට පුරවැසියන්ට හැකියාවක් නැහැ. ලේඛකයන් කලාකරුවන් වැනි සබුද්ධික ජනතාව තමයි අනාගතය කලින් දකින්නේ. ඒ නිසා අපිට යුතුකමක් තියනවා මේ කරුණු ජනතාවට පැහැදිලි කර දීලා ඔවුන්ට මග පෙන්වන්න. ඒ නිසා අපි රටේ සියලු දෙනාගෙන් ඉල්ලා සිටිනවා මේ ජනාධිපතිවරණයේදී මෛත්‍රීපාල සිරිසේන මහතා ජයග්‍රහණය කරලා මේ දුර්දාන්ත පාලනය වෛරයේ යුගය අවසන් කර මෛත්‍රී යුගයක් උදාකරගනිමු කියලා.



# එකම විකල්පය මෛත්‍රීපාල

## ගුණසිරි විතාන



වදුරඹ කියන්නේ මා උපන්ගම. එහි වෙසෙන්නේ ඉතාම අහිංසක මිනිසුන්. නමුත් වදුරඹ අයිති ගාලු දිස්ත්‍රික්කයේ විශාල වෙනසක් ඇතිවුණා. ඒ වෙනස ඉවසන්න බැරිව එක ඇමැතිවරයෙක් වදුරඹ ගමේ පැවැති මෛත්‍රීපාල සිරිසේන මහතාගේ රැස්වීමට පහරදී වේදිකාව විනාශ කර දැමුවා. එතන සිටි අයට පහරදුන්නා. මේක තමයි අද තියන යථාර්තය.

අපි හදවතට කතා කරන්නන් වශයෙන් අපේ පෑන අවියක් කරගෙන තර්ජනයට ගර්ජනයට බය නැතිව ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක් ගොඩනැඟීම සඳහා අද අපිට තියන එකම විකල්පය මෛත්‍රීපාල සිරිසේන මහතා අභිනව ජනාධිපතිවරයා වශයෙන් පත්කිරීමයි. මම පසුගියදා රුසියානු නවකතාවක් කියෙව්වා 'නපුරු පාලකයෝ තුන්දෙනා' කියලා. ඒක කියෙව්වම මට තේරුණා අපේ රටත් අද ග්‍රහණය කරගෙන තියෙන්නේ ඒ වගේ නපුරු පාලකයෝ තුන්දෙනෙක් කියලා.



# යුද බිය වෙනුවට මර බිය

## සරත් විජේසූරිය



මෛත්‍රීපාල සිරිසේන මහතාට සහාය දැක්වීමට විවිධ සංවිධාන දේශපාලන පක්ෂ 65ක් පමණ මේ වන විට එකතු වී සිටිනවා. එහෙත් ඒ හැම දෙනාටම ජනතාව හමුවේ ඔවුන්ගේ අදහස් දැක්වීමට ඇති අවස්ථාව ආණ්ඩුව විවිධ ක්‍රමවලින් අහිමි කර තිබෙනවා. රැස්වීමක් පැවැත්වීමට පිට්ටනියක් ශාලාවක් ලබාගැනීමට බැරි තත්ත්වයක් දැන් ඇතිකරලා තියනවා.

සමාජය තුළට මතයක් පතුරවලා තියනවා පොදු අපේක්ෂකයාගේ මැතිවරණ ව්‍යාපාරය ගමට ගිහින් නෑ කියලා. එහි අර්ධ සත්‍යයක් තියනවා. ඊට එක් හේතුවක් වන්නේ ගම්වල දේශපාලනය කරන අයට එම කටයුතු කරන්න නිදහස අහිමි කර තිබීමයි. එය ඉතාමත්ම සාපරාධි තත්ත්වයක්.

ලේඛකයෝ වශයෙන් කල්පනා කර බලන කොට රටක ලේඛකයෝ සියළු දෙනාම සිටිය යුත්තේ පොදු ජනතාව පැත්තේ. සාධාරණය පැත්තේ. අයුක්තියට විරුද්ධව තමයි ලේඛකයෝ කතා කළ යුත්තේ. මම කල්පනා කරන විදිහට ශිෂ්ට සම්පන්න කිසිම ලේඛකයෙකුට ආණ්ඩුව වෙනුවෙන් පෙනී සිටින්නට හැකියාවක් හෝ කිසිම සදාචාරාත්මක අයිතියක් නැහැ.

ඒ නිසා රටේ සියළු ලේඛකයන්ට, අංකුර ලේඛකයන්ට, පාඨකයන්ට අපි ආයාචනය කරනවා මේ යථාර්ථය තේරුම් ගන්න. අද අපි ජීවත්වන සමාජය තුළ අදහස් ප්‍රකාශ කිරීමේ අයිතිය බරපතල ලෙස උල්ලංඝනය කර තිබෙනවා. ඕනෑම ආයතනයක පුද්ගලයෙක් මුණගැසුනාම කියන්නේ කතාකරන්න බයයි. මොනවා වෙයිද දන්නේ නෑ කියලයි. මාධ්‍යවේදියෝ, ලේඛකයෝ, විශ්වවිද්‍යාලවල ආචාර්වරු, සිවිල් සමාජයේ බොහෝ දෙනෙක් කියන්නේ මේ දුර්දාන්ත ක්‍රමය වෙනස් කරන්න ඕනේ. ඒත් කොහොමද එළියට ඇවිත් කතාකරන්නේ කියලා. යුද බිය නැති රටක් කියා කිව්වාට මර බිය සමාජය තුළ බරපතල ලෙස පැතිරිලා තියනවා. ඒ නිසා මේ පවතින ක්‍රමය වෙනස් කරගත යුතුයි. නීතිය යුක්තිය සාදාරණත්වය සියළු පුරුවැසියන්ට පොදු දේශපාලන ප්‍රතිසංස්කරණ අවශ්‍ය වී තිබෙනවා. ඒ වෙනුවෙන් මෛත්‍රීපාල සිරිසේන මහතා ජයග්‍රහණය කරවීමේ කාර්යභාරයට ලේඛකයෙක් ලෙස මමත් දායක වෙනවා.



# ජනපතිගේ ගමන හෙළා දකිනවා

## කමල් පෙරේරා

ව්‍යවස්ථාව ඉරා දමමින්, රටේ නීතිය නොතකමින් ඒකාධිපතිත්වයක් සඳහා වත්මන් ජනාධිපතිවරයා යන ගමන අපි දැඩිව හෙළා දකිනවා. එයට විරෝධය පලකරන අතර ජනාධිපතිවරණයේදී මෛත්‍රීපාල සිරිසේන මහතා ජයග්‍රහණය කරවා මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය සහ මානව අයිතිවාසිකම් සුරකින වැඩ පිළිවෙළක් සඳහා අපේ සහයෝගය පළ කරනවා.

ඒකාධිපතිත්වයක් කරා යන ගමනක ලකුණු වර්තමාන ජනාධිපතිවරයාගේ ක්‍රියා කලාපය තුළ පැහැදිලිව දකින්නට තියනවා. මේ මැතිවරණ ව්‍යාපාරය ආරම්භ කළාට පසු සියළු රාජ්‍ය බලය මැර බලය යොදාගනිමින් සිවිල් සමාජය භීෂණයට පත්කරමින් යන ගමනක් අපි දකිනවා.



# ප්‍රජාතන්ත්‍රවාදය සඳහා ලේඛකයෝ

**ජනාධිපතිවරණයට විපක්ෂයේ පොදු අපේක්ෂකයා ලෙස තරග වදින මෛත්‍රීපාල සිරිසේන මහතාට ශ්‍රී ලංකාවේ ලේඛකයන්ගේ සහාය පළ කිරීම සඳහා 2014-12-21 දින ප්‍රජාතන්ත්‍රවාදය උදෙසා ලේඛකයෝ සංවිධානය විසින් තිඹිරිගස්යායේදී මාධ්‍ය හමුවක් පවත්වන ලදි. ඩබ්.ඒ. අබේසිංහ, ගුනසේන විතාන, සරත් විජේසූරිය, කරුණාරත්න අමරසිංහ, බොබී ජී, බොතේජු, සිරිසේන විතානගේ, පී.එම්. සේනාරත්න, මොහාන් රාජ් මඩවල, සමන් චන්ද්‍රනාත් වීරසිංහ, මුස්ලිම් ලේඛක ප්‍රජාව නියෝජනය කරමින් එන්.එම්. නිරාශා, දෙමළ ලේඛක ප්‍රජාව නියෝජනය කරමින් සුදාහරන් ඇතුළු ලේඛක ලේඛිකාවන් රැසක් මේ අවස්ථාවට සහභාගි වූහ. මේ ඊට සහභාගි වූ ලේඛකයෝ කළ අදහස් දැක්වීම් කීපයකි.**

## පෙර පිනක් තිබුණොත් මහින්ද පරදියි

### මොහාන් රාජ් මඩවල

බොහෝ අය මේ වෙලාවේ දැඩි බියකින් පසුවෙනවා ඉදිරියට පැමිණ අදහස් ප්‍රකාශ කරන්න. මේ බිය කියන්නේ ඒකාධිපති ක්‍රමයක පූර්ව ලක්ෂණයක්. එසේ නම් වෙන්න යන මේ අනතුර දැක දැක නිහඬව සිටීම කලාකරුවන්ගේ ලේකකයන්ගේ යුතුකම නොවෙයි. මේ වෙලාවේ ලංකාවේ සිටින කිසියම් හෝ කලාකරුවෙක් හෝ කලාකරුවෙක් ලෙස සමාජය ඉදිරියේ පෙනී සිටින පුද්ගලයෙක් තීරණය කරනවා නම් මහින්ද රාජපක්ෂට සහාය දිය යුතුයි කියලා පැහැදිලි ලෙසම එය වරප්‍රසාද සහ වරදාන මත කරන ප්‍රකාශයක් විය යුතුමයි.

දැවැන්ත අනතුරක් අපි ඉදිරියේ තිබෙනවා. අපි අහලා තියනවා කතාවක් පූරුවේ කළ පින් ගැන. මම හිතනවා මහින්ද රාජපක්ෂට පූරුවේ කළ පිනක් තියනවා නම් මේ ජනාධිපතිවරණයෙන් ඔහු පරාජයට පත්විය යුතුයි.

ලිබියාවේ සිටිය ගඩාෆි එරට සිටිය ඉංග්‍රීසි පාලකයා බැහැරව ගිය අවස්ථාවකදී 1969 හමුදා කුමන්ත්‍රණයකින් බලය ලබාග න්නවා. ඉන් පසු ඔහු ජනතාවට දැවැන්ත ලෙස සහන දෙනවා. මිනිසුන්ගේ ජීවන තත්ත්වය දියුණු කරන්න බොහෝ දේවල් කරනවා. දැවැන්ත සහන රාශියක් ජනතාවට ලබාදෙනවා. මේක දැක්කාම ඒ රටේ ජනතාව හිතනවා මෙන්න අල්ලා දෙවියන් සැබවින්ම පහළ වෙලා කියලා.

නමුත් අවුරුදු පහක් දහයක් යන කොට ඔහුට විරුද්ධව කිසිවෙකුට



කතා කරන්න දෙන්නේ නෑ. සියළුම දේශපාලන පක්ෂ තහනම් කරනවා. එකම ප්‍රකාශකයා මේ හමුදා පාලකයා පමණක් වෙනවා. මිනිස්සු මර්ධනය කරනවා. ඔහු වටේ සිටින්නේ කාන්තා හමුදා බලකායක්. ඒ ඔහු සහ ඔහුගේ හමුදාවේ නායකයන් අතින් දූෂණයට ලක්වෙච්ච අය.

මේ විදිහට 1980 පමණ වන විට ගඩාෆි ඉතාම තිරශ්චීන නායකයෙක් බවට පත්වෙනවා. 2011 වෙද්දි තමන්ගේ රටේ ජනතාවම ඔහුට එරෙහිව කැරැලලක් පටන්ගන්නවා. අවසානයේ ඔහු බෝක්කුවක් යටදී වෙඩි පහරින් මිය යනවා. ලංකාවේ ඇතිවෙමින් යන්නෙත් ලිබියාවේ තත්ත්වයමයි. ජනාධිපති මහින්ද රාජපක්ෂටත් එවැනි අවාසනාවන්ත තත්ත්වයට මුහුණ පෑමෙන් වළකින්නට හැකි වන්නේ මේ ජනාධිපතිවරණයෙන් පරාජයට පත්වුවහොත් පමණයි.

අපි මෛත්‍රීපාල සිරිසේන මහතාට සහයෝගය දැක්විය යුත්තේ මේ වෙලාවේ අපිට තිබෙන එකම පැහැදිලි විකල්පය ඔහු පමණක් නිසයි. කාට හරි අහන්න පුළුවන් මහින්ද වෙනුවට මෛත්‍රීපාල පත්කළා කියලා මේ ප්‍රශ්ණ ඔක්කොම විසදෙනවද කියලා. එහෙම කියලා අපි නිහඬව සිටියොත් අනිවාර්යෙන්ම මහින්ද රාජපක්ෂ නැමැති ඒකාධිපතියා ලිබියාව, ටියුනීසියාව, ඊජිප්තුවට කළා මෙන් විනාශයක් මේ රටටත් කරනවා ස්ථිරයි. එසේ වන විට ඇති වන්නේ දෙමළ මුස්ලිම් කැරැල්ලක් පමණක් නොව සිංහල බෞද්ධ කැරැල්ලක්. අන්න ඒ කැරැල්ලට තමන්ගේ ලෙයින් හැදුණු දරුවන් බිලිවෙනවා දකින්නට ඔබ කැමතිද කියා හදවතින් අහලා ජනතාව තීරණයක් ගත යුතුයි. ඒ තීරණය අරගෙන ජනවාරි 8 වෙනිදාට ගිහිල්ලා මෛත්‍රීපාල සිරිසේනට ඡන්දය දෙන්න.

## සැෂේ පැකට් සංස්කෘතියක් බිහිවෙලා

### සමන් චන්ද්‍රනාත් වීරසිංහ



ආර්ථිකය පිළිබඳ විග්‍රහයන් කරන්න මම දන්නේ නෑ. ඒත් මම ගමේ කඩේට ගියාම දකිනවා පුංචි පුංචි පැකට් වැල් එල්ලලා තියනවා. සැෂේ පැකට්. කිරි පිටි, ෂැම්පු, ජෑම්, ඔය වගේ හැම දෙයක්ම තේ හැන්දක් දෙකක් දාපු පැකට් තමයි මේ වැල් එල්ලලා තියෙන්නේ. එදා කිරිපිටි පැකට් එකක් ගෙන ගිය කෙනා අද ගෙනියන්නේ සැෂේ පැකට් එකක්. අද රටේ ඇතිවෙලා තියන ආර්ථික වෙනස මට දැනෙන්නේ ඒකෙන්. මට ඒකෙන් පේනවා අද මිනිස්සුන්ට කන බොන දේත් තේ හැඳිවලින් කිරලා මැනලා අරගෙන යන්න වෙලා තියනවා කියලා. රටේ සැෂේ සංස්කෘතියක් ඇතිවෙලා තියනවා.

මාධ්‍ය නිදහස ගැන කියනවා නම් මම දැන් කොලම් ලියන එකත් නතර කරලයි තියෙන්නේ. මොකද ලියන්න ඉඩ නෑ. කර්තෘ මූලික පත්තර කලාවෙන් ස්වාමි මූලික පත්තර කලාවට ගිහිල්ලා දැන් මේ වෙනකොට රාජ්‍ය මූලික පත්තර කලාවට ගිහින් තියනවා. කර්තෘ මූලික සහ ස්වාමි මූලික පත්තර කලාවල තිබුණු යම් තරමක නිදහසවත් අද රාජ්‍ය මූලික පත්තර කලාවේ නැහැ.

රටේ හැම කෙනෙකුගේම සහයෝගයෙන් යුද්ධය දිනුවට පස්සේ කොටසක් හිතාගත්තා යුද්ධය දිනලා දුන්නේ අපිට කන්න කියලා. අන්තිමට දැන් ඒකාධිපතිවාදයට ජැක් ගහන්න අසරණ බුදුහාමුදුරුවන් විකුණගෙන කන්න බෞද්ධ දේශපාලන පක්ෂයක් හදන්නත් මිනිහෙක් ඉදිරිපත් වෙලා ඉන්නවා.

## දේශපාලන ඉතිහාසයේ සංධිස්ථානයක්

### මහාචාර්ය රත්නසිරි අරංගල

වසර 2500ක ඉතිහාසයේ ඉතාම තීරණාත්මක සංධිස්ථානයකට අපේ රට අද ප්‍රවිශ්ඨ වෙලා තියනවා. අද අපේ තියෙන්නේ 1815 උඩරට ගිවිසුමෙන් පසුව ඇතිවුණ සමාජයයි. ගතවූ ඒ අවුරුදු 200 තුළ ගොඩනැගෙමින් ආ ප්‍රජාතන්ත්‍රවාදී ව්‍යුහයත් සමාජ රටාවත් සිංහල සංස්කෘතිය හා බැදුණු ආචාර ධර්ම පද්ධතියත් වැනසුණු සමාජයකයි අද අපි ජීවත් වන්නේ. ඒ විනාශය ඉතාමත් තීව්‍ර වුණේ ගතවුණු අවුරුදු පහ තුළදියි. එහිදී යුද ජයග්‍රහණය පුද්ගල ජයග්‍රහණයක් හැටියට ඉස්මතු කරමින් ඒ පුද්ගලයන් සමාජයේ සියළුම ආයතන සියළුම සම්පත් භුක්ත් විදින්නට ඉදිරිපත්වීම නිසා.

අපේ රට තුන්වන ලෝකයේ යැයි හැදින්වූ රටවල් අතරින් ඉතා ඉහළ



සාක්ෂරතා මට්ටමක් තියන රටක්. 90% කට පමණ හොද බුද්ධියක් තියනවා. ඒ නිසා මේ වෙනස ඇතිවුණේ ඒ ජනතාව අතරින්මයි.

අනෙක් පැත්තෙන් අපේ තියෙන්නේ අවුරුදු 80ක් පරණ දේශපාලන පක්ෂ ව්‍යුහයක්. පැරණිම දේශපාලන පක්ෂය වන ලංකා සමසමාජ පක්ෂය බිහිවුණේ 1935දි. ඉන් පසු හතලිස් ගණන්වල එක්සත් ජාතික පක්ෂයත් පනස් එකේදි ශ්‍රී ලංකා නිදහස් පක්ෂයත් බිහිවුණා. ඒ පක්ෂ බිහිවුණ ලෝක දේශපාලනික සංස්කෘතික සහ ආර්ථික වටපිටාව නෙවෙයි අද තියෙන්නේ. 90 දශකය ආරම්භ වන්නේ එතෙක් කදවුරු දෙකකට බෙදී තිබුණු ලෝකය ගෝලියකරණය සහ නව ලිබරල් ක්‍රමයේ ව්‍යාප්තියත් එක්ක තනි කදවුරක් බවට පත්වීමෙන්. ඒ නිසා තවදුරටත් අපිට අර පැරණි දේශපාලන පක්ෂ ක්‍රමයට අනුව අපි ශ්‍රී ලංකා අපි යූ ඇන්පී කියා සිතමින් බෙදී සිටින්නට පදනමක් නැහැ.

අද ඇතිවෙලා තියෙන්නේ 1965 ඇතිවුණු දේශපාලන තත්ත්වය වගේ එකක්. එදා ජාති ආගම් පක්ෂ භේදයෙන් තොරව සියළු දෙනා ජාතික රජයක් හැදීමට එක්වුණා. අද ඊටත් වඩා පුළුල් විදිහට එක්වීමක් තියනවා. වාමාංශික පක්ෂ නියේජනය කළ වාමාංශික පක්ෂත් සිංහල බෞද්ධ ජන විඥානය පුළුල් කළ හෙළ උරුමය වගේ පක්ෂත් ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ හොරකම්වලට සම්බන්ද නොවී අවංකව දේශපාලනය කළ සියළු දෙනාත් අද එක්වෙලා සිටිනවා. මේ පෙළ ගැස්ම අපේ දේශපාලන ඉතිහාසයේ සංධිස්ථානයක්. රටේ සබුද්ධික පුරවැසියන්ගේ ප්‍රබෝධය 2015දී අලුත් ලංකාවක් ඇති කිරීම සඳහා පෙළගැසී තිබෙනවා.

**සටහන සහ ඡායා**
**ශ්‍රීලාල් සෙනෙවිරත්න**

# රණය 2015
# පෙනෙන හැටි

## නිදහස් සහ සාධාරණ නෑ
### -පැෆරල්

## රාජ්‍ය මාධ්‍ය ජනපතිට සින්නවෙලා
### -ට්‍රාන්ස්පේරන්සි



සන්ධාන රැළිය සඳහා බස් 500 කට අධික ප්‍රමාණයක් යොදාගෙන තිබිණි. එක්සත් ජනතා නිදහස් සන්ධානය විසින් පෝස්ටර් ප්‍රවාහනය කිරීම සඳහා ධීවර සංස්ථාවට අයත් වාහන යොදාගෙන තිබිණි.

4 මැතිවරණ ප්‍රචාරක කාර්යාල ලෙස සහ ප්‍රචාරක කටයුතු සඳහා රජයට අයත් පරිශ්‍රයන් යොදාගැනීම.

මැතිවරණ ප්‍රචාරක රැස්වීම් පැවැත්වීම සඳහාත් කටවුට් ප්‍රදර්ශනය කිරීම සඳහාත් රජයට අයත් පරිශ්‍රයන් භාවිතා කොට ඇත.

5 රාජ්‍ය අංශයේ සේවකයන් සහ බන්ධනාගාර රැඳවියන් මැතිවරණ ප්‍රචාරක කටයුතුවල ශ්‍රමිකයන් ලෙස භාවිතා කිරීම

මැතිවරණ ප්‍රචාරක කටයුතු සඳහා රාජ්‍ය සේවකයන් , විශේෂයෙන් රාජ්‍ය ආයතන වල කම්කරු ශ්‍රේණියේ සේවකයන් යොදාගැනීම සිදුකර ඇත. මාර්ග සංවර්ධන අධිකාරියේ කම්කරු ශ්‍රේණියේ සේවකයන් පෝස්ටර් ඇලවීම සඳහා යොදවා ඇත. අකුරැස්ස නගරයේ පැවැති මැතිවරණ ප්‍රචාරක රැස්වීමක් සඳහා අදාළ වේදිකාව ඉදිකිරීමටත් සැරසිලි කටයුතු සිදු කිරීමටත් බන්ධනාගාර රැඳවියන් යොදාගෙන ඇත.

6 එක්සත් ජනතා නිදහස් සන්ධාන අපේක්ෂකයා වෙනුවෙන් ප්‍රචාරක කටයුතු සිදු කිරීම සඳහා සහ ඔහුව ප්‍රවර්ධනය කිරීම සඳහා රාජ්‍ය අංශ සේවකයන් මෙහෙයවීම.

රාජ්‍ය අංශයේ මණ්ඩලවල සහ අධිකාරීවල සේවකයන් මේ බලපෑම් වලට විශේෂයෙන් ලක්ව ඇත. මැතිවරණ ප්‍රචාරක පරමාර්ථ සඳහා තරුණ සේවා නිලධාරීන් යොදාගෙන ඇත. ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ ඩිපෝ කාර්යාල සඳහා ජනාධිපතිවරයා වෙනුවෙන් ප්‍රචාරක කටයුතු කරන ලෙස එක්සත් ජනතා නිදහස් සන්ධාන වෘත්තීය සමිති නායකත්වය උපදෙස් නිකුත් කර ඇත.

7. මැතිවරණ ප්‍රචාරක අරමුණු සඳහා රාජ්‍ය උත්සව උපයෝගී කොට ගැනීම

මෙය ජනාධිපතිවරයාගේ මැතිවරණ ව්‍යාපාරයේ ප්‍රධාන අංගයක් වී තිබේ. ජනාධිපතිවරයා මැතිවරණ ප්‍රචාරක අරමුණු සඳහා වූ වේදිකාවක් වශයෙන් රාජ්‍ය උත්සව උපයෝගී කොට ගනිමින් පවතී. සාලමුල්ල ප්‍රදේශයේ නිවාස සංකීර්ණයක් විවෘත කිරීම, විශ්ව විද්‍යාල සිසුන් සඳහා මහපොළ දීමනා ලබා දීමේ උත්සවය සහ ඇඹිලිපිටිය ප්‍රදේශයේ මහජන පොළක් විවෘත කිරීමේ උත්සවය ඒ අතරින් ප්‍රධාන අවස්ථාවන් විය.

7. ප්‍රධාන පෙළේ රාජ්‍ය අංශ ආයතන වල සිදු කෙරෙන ස්ථාන මාරු කිරීම් සහ නව පත් කිරීම්

පොලිස්පතිවරයාගේ අදහස් නිසි ලෙස විමසීමකින් තොරව නීතිය හා සාමය ආරක්ෂා කිරීමේ අමාත්‍යංශයට අලුතින් පත් කළ ලේකම්වරයා ( හිටපු පොලිස්පතිවරයෙකු වන මහින්ද බාලසූරිය) විසින් මැතිවරණය ප්‍රකාශයට පත්කිරීමට ආසන්න කාලය තුළ සිදුකළ ස්ථාන මාරුකිරීම් සංඛ්‍යාව 500 කට ආසන්නය. මෙම ලේකම්වරයා විසින් පොලිස්පතිවරයා මඟ හැර නව ස්ථාන මාරු කිරීම් සිදු කොට ඇත. පොලිස් සැරයන්වරු උප පොලිස් පරීක්ෂකවරු දක්වා උසස් කිරීම සඳහා සම්මුඛ පරීක්ෂණ පැවැත්වා ඇත, අලුත්ගම පොලිසියේ ස්ථාන භාර නිලධාරීවරයාට සහ වේයන්ගොඩ පොලිස් ස්ථානයේ ස්ථාන භාර නිලධාරීවරයාට ස්ථාන මාරුවක් ලබා දී ඇත.

රාජ්‍ය අධ්‍යාපන අංශය සඳහා පුද්ගලයින් 210 දෙනෙක් අලුතින් බඳවා ගෙන ඇත. ක්‍රීඩා අමාත්‍යංශය විසින් ක්‍රීඩා නිළධාරීන් පත් කිරීම සඳහා උත්සාහයක් පැවැති අතර මෙය පසුව අත්හිටුවනු ලැබීය.

8. විපක්ෂයේ පොදු අපේක්ෂකයා සඳහා වන මැතිවරණ ප්‍රචාරක අවකාශය සීමා කිරීම

එක්සත් ජනතා නිදහස් සන්ධාන පාලනය යටතේ පවතින පළාත් පාලන ආයතන පොදු ස්ථාන සඳහා වූ ප්‍රවේශය ප්‍රතික්ෂේප කර ඇත. රුවන්වැල්ල සහ අකුරැස්ස ප්‍රාදේශීය සභා සහ තලාව මහජන ක්‍රීඩාංගනය රැස්වීම් සඳහා ලබා දී නොමැත. කොත්මලේ පැවැති පොදු අපේක්ෂකයාගේ රැස්වීම සඳහා වූ විදුලිය විසන්ධි කර ඇත. රැස්විමට සහභාගී වීමට පැමිණෙමින් සිටි පිරිස් රැගත් වාහන වලට බාධා කර ඇත. ගම්පහ ප්‍රදේශයේ නව ප්‍රජාතන්ත්‍රවදී පෙරමුණු රැස්වීමකට බාධා කර ඇත. මහනුවර දිස්ත්‍රික් එක්සත් ජාතික පක්ෂයේ චිත්‍රා මන්තිලකට මරණ තර්ජන එල්ල කළ බවට චෝදනා ඉදිරිපත්වී ඇත.

9. එක්සත් ජනතා නිදහස් සන්ධාන මැතිවරණ ප්‍රචාරක කටයුතු සඳහා රාජ්‍ය මාධ්‍ය පූර්ණ වශයෙන් උපයෝගී කොට ගැනීම.

**සිවිල් සමාජය සහ දේශපාලන පක්ෂ විසින් විරෝධතා මතු කළ පසු කොළඹ නගරයේ සෑම වීදියකම පාහේ ප්‍රදර්ශනය කොට තිබූ කටවුට් දැන්වීම් සැළකිය යුතු ප්‍රමාණයකින් ඉවත් කොට ඇත. එසේ වුවද වෙනත් නගර වල තවදුරටත් පෝස්ටර් සහ කටවුට් විශාල වශයෙන් ප්‍රදර්ශනය කෙරෙමින් තිබේ. නාම යෝජනා බාරගැනීමෙන් පසුව මුල් සතිය තුළ ප්‍රචණ්ඩ සිදුවීම් වල අඩු වීමක් නිරීක්ෂණය කළ හැකි වුවද මේ වන විට එම තත්ත්වය වෙනස් වෙමින් පවතී.**

ජනාධිපතිවරයාගේ මැතිවරණ ව්‍යාපාරය සඳහා රාජ්‍ය මාධ්‍ය ඉතාම ඉහළ මට්ටමකින් උපයෝගී කොට ගැනෙමින් තිබෙන අතර මෙය විපක්ෂය සඳහා ලැබෙන මාධ්‍ය ආවරණය අබිබවා ගිය ප්‍රචාරණයකි.

7. සංවිධානාත්මක ප්‍රචණ්ඩත්වය

පුපුරන ද්‍රව්‍ය යොදාගෙන සිදු කළ පහරදීම් වල සිට බරපතල අඩත්තේට්ටම් කිරීම් , වෙඩි තැබීම්, තර්ජනය කිරීම් සහ ගිනි අවි යොදාගෙන සිදු කරන බිය වැද්දීම් දක්වා පරාසයක විහිදෙන ප්‍රචණ්ඩ සිදුවීම් වාර්තා වී තිබේ. තලාව ප්‍රදේශයේ දී නව ප්‍රජාතන්ත්‍රවාදී පෙරමුණු අපේක්ෂකයාගේ අපේක්ෂකත්වය ප්‍රකාශ කිරීම සමරමින් සිටි තරුණයෙකුට තලාව ප්‍රාදේශීය සභා සභාපති ටී.එම්. ඉන්දික උදයකුමාර සහ තවත් පිරිසක් පොරොවකින් සහ පොලු වලින් පහර දී ඇත. පේරාදෙණිය වැලිගල්ලේදී එක්සත් ජනතා නිදහස් සන්ධාන පාක්ෂිකයෙකුට ප්‍රචාරක කාර්යාලය තුළ දී අඩත්තේට්ටම් කර ඇත. විපක්ෂයේ පොදු අපේක්ෂකයාගේ අපේක්ෂකත්වය ප්‍රකාශ කිරීම සමරමින් රතිඤ්ඤා පත්තු කරමින් සිටි පුද්ගලයන් සමූහයකට වෙඩි ප්‍රහාරයක් එල්ල කර ඇත. හම්බන්තොට එක්සත් ජනතා නිදහස් සන්ධාන ප්‍රචාරක කාර්යාලයක් පහර දීමට ලක් විය.

ජනාධිපතිවරණයේදී රාජ්‍ය මාධ්‍ය යොදාගන්නා ආකාරය පිළිබඳ ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා ආයතනයේ පොදු දේපල අයථා පරිහරණ නිරීක්ෂණ වැඩසටහන මගින් සිදුකර ඇති නිරීක්ෂණ කීපයක් එම ආයතනය මගින් මැතිවරණ කොමසාරිස්වරයාට දනුම්දී තිබේ. ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව, ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව, සීමාසහිත ශ්‍රී ලංකාවේ එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම (ලේක්හවුස්) හා ස්වාධීන රූපවාහිනී ජාලය (අයිටීඑන්) එම නිරීක්ෂණයට ලක් කර ඇති ආයතන වෙයි. රාජ්‍ය මාධ්‍ය ජනාධිපතිවරයාගේ මැතිවරණ ප්‍රචාරක යාන්ත්‍රණයේ කොටසක් බවට පත්ව ඇති ආකාරය එම නිරීක්ෂණ තුලින් දකගත හැකිය.

මීට අමතරව ට්‍රාන්ස්පේරන්සි මැතිවරණ නිරීක්ෂකයන් විසින්ද ජනාධිපතිවරණය සඳහා පොදු දේපල යොදාගන්නා අවස්ථා විශාල වශයෙන් අනාවරණය කරගෙන ඇති අතර ඒ පිළිබඳ මැතිවරණ කොමසාරිස්වරයාට පැමිණිලි කර තිබේ. එහෙත් ජනාධිපතිවරයාගේ මැතිවරණය ප්‍රචාරක ව්‍යාපාරය තුළ සිදුවන එම කටයුතු පාලනය වන ආකරයක් පෙනෙන්නට නොමැත.

ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයක් තහවුරු වෙන්නේ මැතිවරණ පැවැත්වීම පමණක් නොව ඒවා නිදහස් හා සාදාරණ මැතිවරණයන්ද වුවහොත් පමණකි. ඒ අනුව ජනාධිපතිවරණය නිදහස් සහ සාදාරණ එකක් නොවන බව දනටමත් පැහැදිලිය.

**සටහන - ශ්‍රීලාල්**
**ඡායාරූප - නෞලි විමලරත්න**

## බඳ නිරීක්ෂණ
## දක්වා)

**ඉංග්‍රීසි) පුවත් රාත්‍රී 09.00**




සන්ධාන අපේක්ෂකයාට සිය පක්ෂයේ වෙනුවෙන් දින හතේම ප්‍රධාන සිරස්තල ත් සෙසු ජනාධිපති ධුර අපේක්ෂකයන් වාදී පෙරමුණේ අපේක්ෂකයාට හැර කයකුට ප්‍රධාන සිරස්තල අතර එවැනි බව නිරීක්ෂණය වේ. නව ප්‍රජාතන්ත්‍රවාදී ාටද එම අවස්ථාව හිමිවී ඇත්තේ දින

එක්සත් ජනතා නිදහස් සන්ධානයේ පය වර්ධනය කිරීම සඳහා වන ශීර්ෂ දා ඇති බව නිරීක්ෂණය වන අතර ණ් අප්ක්ෂකයා වෙනුවෙන් වෙන්ව ඇති දී අපේක්ෂක ප්‍රතිරූපය සෘණාත්මකව පැවති බව නිරීක්ෂණය විය.

# වෙනසක් සඳහා පුරවැසියෙකුගේ න්‍යායපත්‍රයක්

ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක් තුළ වෙනසක් සඳහා ඉල්ලා සිටීම කුමන්ත්‍රණයක් හෝ දේශද්‍රෝහී ක්‍රියාවක් නොව පුරවැසියකුගේ මූලික අයිතිවාසිකමකි. රටේ පවතින දේශපාලන තත්වය පිළිබඳව අපට තෘප්තිමත් විය නොහැකි නම් වෙනසක් සෙවීම අපගේ පරම යුතුකමකි. ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක පුරවැසියා තරම් අන් කිසිවෙකුත් වැදගත් නොවන බව අප කිසි දිනක අමතක කළ යුතු නැත. ආණ්ඩුකරණය සඳහා ඇති බලය ජනතා ස්වෛරීත්වයේ කොටසකි. එහෙත් අපට මෙය නිතර අමතක වන අතර ආණ්ඩුකරණය යනු දේශපාලකයින් ප්‍රධාන නළුවන් වන නාට්‍යයක් සේ සලකා සැනසී සිටිමු. පුරවැසියන් වන අප අපගේ දේශපාලන ඉරණම සකස් කොට ගැනීමේ වගකීම දැරිය යුතු බව පිළිග ැනීම වැදගත් වේ.

ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රමයක් තුළ, හැම විටම ජීවගුණයෙන් යුතු විපක්ෂයක් පැවතීම අතිශය වැදගත්ය. ප්‍රජාතන්ත්‍රවාදී සම්ප්‍රදායක් තුළ සැබවින්ම නිමග්න වූ කවර හෝ පරිණත දේශපාලකයෙක් මෙහි වැදගත්කම පිළිගන්නේය. දීර්ඝ කාලයක සිට ශ්‍රී ලංකා දේශපාලනයේ පවත්නා බරපතලම ප්‍රශ්නය වන්නේ ජීවගුණයෙන් යුත් විරුද්ධ පක්ෂයේ අපේක්ෂකයෙකු නොමැති වීමය. දැන් ඒ තත්වය වෙනස් වී තිබේ. අප මේ අවස්ථාව උපයෝගී කොට ගනිමින් අපගේ අදහස් මහ හඬින් හා පැහැදිලිව ප්‍රකාශ කළ යුතුව තිබේ. දේශපාලන වෙනසක් සඳහා වූ න්‍යාය පත්‍රය සම්පාදනය කරන්නේ පුරවැසියන් වන අප බව සහතික කළ හැක්කේ ඒ ආකාරයෙනි.

පහත දක්වෙන්නේ පුරවැසියකු ලෙස වෙනසක් සඳහා මා විසින් ඉල්ලා සිටිනු ලබන න්‍යාය පත්‍රයයි. මා මෙය ඉදිරිපත් කරන්නේ කිසිදු අහංකාරයකින් තොරව හා ප්‍රජා වගකීම පිළිබඳව අවබෝධයකින් යුක්තවත් මගේ හෘදය සාක්ෂිය පරීක්ෂා කොට බැලීමෙන් හා මා ගරු කරන මගේ සහෝදර රටවැසියන්ගේ අදහස්වලට සවන් දීමෙන් පසුවත්ය.

### ශිෂ්ට සම්පන්න දේශපාලන නායකත්වයක්

- ප්‍රථමයෙන්ම හා ප්‍රධාන වශයෙන්ම, දේශපාලන නායකත්වයේ ශිෂ්ට සම්පන්න භාවයක් දැකීමට මම කැමැත්තෙමි. වීරත්වයන් හා පුද්ගලික නිර්භීතභාවය හෝ ශරීර ප්‍රමාණයට වඩා විශාල වූ පෞරුෂයක් නායකයෙකු තුළ නොතිබීම පිළිබඳව සමාව දීමට මට හැකිය. මට අවශ්‍ය වන්නේ දේශපාලන ශිෂ්ට සම්පන්න භාවයයි. එය නොමැතිව මා අපේක්ෂා කරන වෙනස ඇති විය නොහැකිය.

- ශිෂ්ට සම්පන්න නායකත්වයක් යන්නෙන් මා අදහස් කරන්නේ ජනතාවගේ ප්‍රජාතන්ත්‍රවාදී අයිතීන් හා නිදහස ද, සෑම පුද්ගලයෙකුගේ හා ජන කණ්ඩායමකට සමාන අභිමානයකින් හා බියකින් තොරව ජීවත් වීමට සැලැස්වීමේ ප්‍රතිපත්තිය මත අවංක ලෙස පිහිටා කටයුතු කරන නායකත්වයකි. ශිෂ්ට සම්පන්න නායකත්වයක් සමාජයක විවිධත්වය පිළිගත යුතුය. එය නීතියේ පාලනය මත පදනම් වූ ආණ්ඩුකරණයක් මත පදනම් විය යුතුය. කෙටියෙන් කිවහොත් මා අපේක්ෂා කරන්නේ පුරවැසිභාවයට හා ප්‍රජාතන්ත්‍රවාදයට ගරු කරන සානුකම්පික නායකත්වයකි.

**මම හීෂණ දේශපාලනය පිළිකුල් කරමි. එය නවත්වා දැමිය යුතුය. නොයෙක් සතුරන් මවමින් හා කුමන්ත්‍රණ කතා පතුරුවමින් ජනතාව බිය වැද්දීමට තැත් කිරීම දුර්වලභාවයේ ලක්ෂණයකි. එයින් පෙනෙන්නේ පාලකයා අනාරක්ෂිත බවය. ශිෂ්ට දේශපාලනය ජනතාවගේ විශ්වාසය දිනා ගත යුතුය. ඔවුන්ගේ බුද්ධියට ගරු කළ යුතුය. යුද්ධය අවසන් වීම පිළිබඳව අපි සතුටු වූයෙමු. ජනාධිපතිවරයාට නිසි කෘතඥතාව පළ කළෙමු. එසේ කළේ මින් ඉදිරියට බියෙන් තොරව ජීවත් විය හැකි වේය යන විශ්වාසයෙනි.**

- වර්තමානයේ පවත්නා ඉතා අවස්ථාවාදී හා නරුමවාදී වූත් ඕනෑම නීති විරෝධී ක්‍රියාවක යෙදී තම වුවමනාවන් ඉටු කොට ගැනීමට අනුබල දෙන්නා වූත් ක්‍රමය සහමුලින්ම වෙනස් කළ යුතුව ඇත්තේය. මෙබඳු තත්වයක් ඇති කළ හැක්කේ වචනයෙන් පමණක් නොව ක්‍රියාවෙන් ද ශිෂ්ට සම්පන්න වූ නායකත්වයක් රටට ලැබෙන්න් නම් පමණි.



**ආචාර්ය දීපිකා උඩගම**
පේරාදෙණිය විශ්වවිද්‍යාලය

- ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණය වැදගත් වුව ද ව්‍යවස්ථාවෙන් පමණක් දේශපාලන ශිෂ්ට සම්පන්නභාවය ඇති කළ නොහැකිය. ජනාධිපති මැන්ඩෙලා අශිෂ්ට පුද්ගලයෙකු වී නම් ඔහුට දකුණු අප්‍රිකාවේ ශක්තිමත් ප්‍රජාතන්ත්‍රවාදයක් හා බහුජන හිතකාමී දේශපාලන සංස්කෘතියක් බිහි කිරීමට හැකි නොවන්නේය.

- දේශපාලන හීෂණයක් පිටු දැකීම අපේක්ෂා කළ හැක්කේ ශිෂ්ට සම්පන්න දේශපාලන නායකත්වයකින් පමණි. එය දේශපාලන මැර ක්‍රියාවන් හා අපරාධයට දඬුවම් නොකිරීම උත්කර්ෂයට පත් නොකරන්නේය. එය ජනතාව පීඩාවට පත් කරන පාතාල ලෝකයේ අපරාධකරුවන් සමග සුහද සම්බන්ධතා නොපවත්වන්නේය.

- දූෂණය ප්‍රතික්ෂේප කිරීම ද අපේක්ෂා කළ හැක්කේ එබඳු නායකත්වයකින් පමණි. පුහු ආටෝපය එබඳු නායකත්වයක් විසින් ප්‍රතික්ෂේප කරනු ලබන අතර සරල ජීවන රටාවක් තෝරා ගනු ලබන්නේය. වගකීමකින් තොර ලෙස මහජන මුදල් වියදම් කිරීම එබඳු නායකත්වයක ලජ්ජාවට හේතු වන්නේය.

- එබඳු නායකත්වයකින් නිරන්තරව මහජනයාට වග වීමත් ආණ්ඩුකරණයේ දී විනිවිදභාවයකින් යුක්ත වීමත් මම අපේක්ෂා කරමි. සිය ඥාතීන් ද සමග දේශපාලකයින් අති විශාල ආරක්ෂක බලඇණි පිරිවර කොට ගෙන මහජනයාට හිරිහැර වන ආකාරයෙන් හැසිරීම ද එබඳු නායකත්වයකට ලජ්ජාවට හේතුවක් වනු නියතය.

- ශිෂ්ට සම්පන්න දේශපාලන නායකත්වයක් නිර්ලජ්ජිත අනුග්‍රාහක දේශපාලනයක ද නොයෙදෙනු ඇත. රටේ සියලු ජනයා "අපේ අය" විය යුතුය. සියලු ජනයා සමාන ලෙස සලකනු ලැබිය යුතුය.

- මම හීෂණ දේශපාලනය පිළිකුල් කරමි. එය නවත්වා දැමිය යුතුය. නොයෙක් සතුරන් මවමින් හා කුමන්ත්‍රණ කතා පතුරුවමින් ජනතාව බිය වැද්දීමට තැත් කිරීම දුර්වලභාවයේ ලක්ෂණයකි. එයින් පෙනෙන්නේ පාලකයා අනාරක්ෂිත බවය. ශිෂ්ට දේශපාලනය ජනතාවගේ විශ්වාසය දිනා ගත යුතුය. ඔවුන්ගේ බුද්ධියට ගරු කළ යුතුය. යුද්ධය අවසන් වීම පිළිබඳව අපි සතුටු වූයෙමු. ජනාධිපතිවරයාට නිසි කෘතඥතාව පළ කළෙමු. එසේ කළේ මින් ඉදිරියට බියෙන් තොරව ජීවත් විය හැකි වේය යන විශ්වාසයෙනි. එහෙත් දැන් අපට නිතර දැන ගැනීමට සලස්වා ඇත්තේ තවම යුද්ධය අවසන් වී නැති බවක්ය. මගේ අදහසේ හැටියට සතුරා සිටින්නේ රජය තුළමය. ඒ සතුරා නම් අයහපත් පාලනයයි. ජනතාව සටන් කළ යුත්තේ මේ සතුරාට එරෙහිවය.

### ව්‍යවස්ථා සංශෝධනය

- විධායක ජනාධිපති ක්‍රමය විසින් රටේ ආණ්ඩුකරණයේ ප්‍රජාතන්ත්‍රවාදී හරය විනාශ කර දමනු ලැබ ඇති බැවින් එය අහෝසි කර දැමිය යුතුය. දහ අට වන සංශෝධනය ද එසේම පිටු දැකිය යුතුය. වහාම අවශ්‍යව ඇති සංශෝධන මේවාය. එසේ වුව ද ආණ්ඩුක්‍රමව්‍යවස්ථා සංශෝධනය එතැනින් නැවැත්විය යුතු නැත.

- එය සකස් කිරීමේ දී පුළුල් මහජන සහභාගීත්වයක් ලබා ගනිමින් සම්පූර්ණ නව ව්‍යවස්ථාවක් සම්පාදනය කිරීම අවශ්‍යය යන්න මගේ අදහසයි.

- ව්‍යවස්ථා සංශෝධනය මගින් ශක්තිසම්පන්න ප්‍රජාතන්ත්‍රවාදී ආයතන පද්ධතියකින් හා ක්‍රියාවලියකින් මෙහෙයවනු ලබන ආණ්ඩුකරණයක් සහතික කරනු ලැබිය යුතු අතර එම ක්‍රියාදාමයන් පුද්ගලයන්ගේ වුවමනාවන්ට යටත් නොවිය යුතුය. බලවත් පුද්ගලයන්ගේ ආගමනයන් හා නික්ම යාම් සිදු වුව ද ආයතන හා පද්ධතීන් කිසිදු බාධාවකින් තොරව දිගටම පැවතිය යුතුය.

- පාර්ලිමේන්තුවට වග කියන විධායකයක්, නියෝජනයක් සහිත (පක්ෂ මාරු කරන්නවුන්ට ආසන අහිමි වන) හා කාර්යක්ෂම පාර්ලිමේන්තුවක් සහ ශක්ති සම්පන්න වූ ස්වාධීන අධිකරණයක් දැකීම මාගේ අපේක්ෂාවයි. ශක්ති සම්පන්න අධීක්ෂණයන් හා තුලනයන් ද තිබිය යුතුය.

**දේශපාලන හීෂණයක් පිටු දැකීම අපේක්ෂා කළ හැක්කේ ශිෂ්ට සම්පන්න දේශපාලන නායකත්වයකින් පමණි. එය දේශපාලන මැර ක්‍රියාවන් හා අපරාධයට දඬුවම් නොකිරීම උත්කර්ෂයට පත් නොකරන්නේය. එය ජනතාව පීඩාවට පත් කරන පාතාල ලෝකයේ අපරාධකරුවන් සමග සුහද සම්බන්ධතා නොපවත්වන්නේය.**

- අධිකරණයේ සහ වැදගත් මෙහෙයුම් ආයතන වන අධිකරණ සේවා කොමිසම, මැතිවරණ කොමිසම, අල්ලස් හා දූෂණ කොමිසම, මානව හිමිකම් කොමිසම, පොලිස් කොමිසම, රාජ්‍ය සේවා කොමිසම හා ගණකාධිපති කාර්යලය හා ඇටර්නි ජෙනරල් කාර්යාලය වැනි වැදගත් කාර්යාලවලද ස්වාධීනත්වය සහතික තරන ව්‍යවස්ථාමය යාන්ත්‍රණයක් ද ස්ථාපිත කළ යුතුය. දහහත් වන ව්‍යවස්ථා සංශෝධනයෙන් අපේක්ෂා කළ ආකාරයටත් වඩා ශක්ති සම්පන්න ව්‍යවස්ථා මණ්ඩලයක් ඉතා අවශ්‍යය. දේශපාලන බලපෑම්වලින් තොර වූ පත් කිරිමේ ක්‍රියාදාමයක් මගින් මෙම ආයතනයන්ට වඩාත්ම සුදුසු පුද්ගලයන් පත් කොට ගැනීම සහතික කිරීම ද තීරණාත්මක ලෙස වැදගත් කාර්යයකි. මෙසේ පත්

කරනු ලබන්නන්ගේ ධුර කාලය පිළිබඳ සහතිකයක් තිබිය යුතුය.

- නව ආණ්ඩුක්‍රමව්‍යවස්ථාවට ශක්තිමත් අයිතිවාසිකම් පණතක් අවශ්‍යයයි සිතමි. එය පුද්ගල අයිතීන් මෙන්ම කණ්ඩායම් අයිතීන් යන අංශ දෙකම පිළිගන්නා එකක් විය යුතු අතර ආර්ථික, සමාජයීය හා සංස්කෘතික අයිතීන් ද ප්‍රජා හා දේශපාලන අයිතීන් ද එහි විෂය පථයට අයත් විය යුතුය.

- ශ්‍රී ලාංකික සමාජයේ විවිධ අංශයන්ගෙන් පවත්නා බහුවිධතාවය පිළිබඳව ව්‍යවස්ථානුකුල පිළි ගැනීමක් තිබිය යුතුය. නව ව්‍යවස්ථාවක් සම්පාදනය කිරීමේ අවස්ථාව මෙරට ජාතීන් අතර සංහිඳියාවක් තහවුරු කොට ගැනිම සඳහා උපකාරී වන පුළුල් සාකච්ඡාවක් සඳහා ඉතා යෝග්‍ය අවස්ථාවක් සලසන්නේය.

- අවසාන වහයෙන් ආණ්ඩුක්‍රමව්‍යවස්ථාවේ මූලික ලක්ෂණ සහතික කිරීමක් ද සිදු විය යුතුය. එයින් අදහස් වන්නේ ඒවා පාර්ලිමේන්තුව මගින් සංශෝධනය කළ නොහැකි විය යුතු බවයි. මූලික ලක්ෂණ කවරේද යන්න තීරණය කළ යුතු වන්නේ ජනතාවගේ පරමාධිපත්‍යයේ දෘෂ්ටිකෝණයෙන්ය.

- ව්‍යවස්ථා ප්‍රාරම්භකත්වයක් ලෙස තොරතුර දැනගැනීමේ අයිතිය පිළිබඳ පණතට ප්‍රමුඛතාවයක් දිය යුතුයයි සිතමි.එහෙත්

### මානව සංවර්ධනය

- මා මෙහි දී අදහස් කරන සංවර්ධනය මානව සංවර්ධනයයි. ඒ අනුව රටක ආර්ථික ක්‍රියාකාරකම සාමාන්‍ය පුරවැසියාගේ යහපත සඳහා ඔවුන්ට ප්‍රමාණවත් වැටුපක් ලබා ගැනීම, හොඳ ආහාර වේලක් ලබා ගැනීම, දරුවන්ට අධ්‍යාපනයක් ලබා දීම, සෞඛ්‍ය පහසුකම් හා විනෝදාස්වාදය ආදිය සඳහා අතමිට මුදල් තිබිය හැකි තත්වයක් ඇති කිරිම සහතික කළ යුතු වේ. නිතරම ණය වීම වෙනුවට ඔවුනට ඉතිරිකිරීම් තිබිය යුතුය.

- යටිතල පහසුකම් සංවර්ධනය ද වැදගත්ය. එහෙත් එයින් පමණක් මානව සංවර්ධනය සිදු නොවේ. අලංකාර නගරයක ජීවත් වීමට ලැබීම යහපත්ය. එහෙත් අලංකාර උද්‍යාන හා පොකුණු, සුඛෝපභෝගී නිවාස සංකීර්ණ, සුප්‍රකට වෙළඳ නාම සහිත ඇඳුම් ආයිත්තම් වෙළඳ සැල් හා අලංකාර හෝටල්වලින් පමණක් මානව සංවර්ධනය පිලිබිඹු වේ ද? මෙවැනි ක්‍රමයක් ප්‍රශ්නකාරී තත්වයකනට පත් වන්නේ මෙම සමහර ව්‍යාපෘතීන් මහජන යහපත නොතකා සමහර පුද්ගලයන්ගේ හිතුවක්කාරි නිගමන මත සිදු කොට තිබිම නිසාය. මෙහි වඩාත්ම භයානක පැත්ත වන්නේ මේ සියල්ල සිදු කොට ඇත්තේ රටේ ඉදිරි පරම්පරා ගණනක් ණය කරුවන් කරමින් ලබා ගත් ණයවලින් වීමය. මෙවැනි හිතුවක්කාරී කටයුතු ස්ථිර වශයෙන්ම වහා නැවැත්විය යුතුය.

- මා දැකීමට කැමති තත්වය වන්නේ අර්ථවත් කර්මාන්තයන්හි, වතු වගා අංශයේ හා කෘෂිකරමාන්තයේ ආයෝජනයන්ය. තොරතුරු තාක්ෂණය ලංකාවේ ඉතා දියුණු තත්වයකට පත් වේයයි කලකට ඉහත දී අපි බලාපොරොත්තු තබා ගෙන සිටියෙමු. එහෙත් එය එසේ සිදු වී නැත. අපට ඉතා දියුණු තත්වයේ මානව සම්පත් තිබේ. එම සම්පත්වලින් නිසි ප්‍රයෝජන ලබා ගෙන නොමැත්තේ ඇයි? අපට හෙද-හෙදියන්, ඉංග්‍රීසි ගුරුවරුන්, තොරතුරු තාක්ෂණ විශේෂඥයින් පුහුණු කොට තොග ගණනින් පිටරට රැකියාවන්ට යැවිය නොහැක්කේ මන්ද?

- ශිෂ්ට සම්පන්න දේශපාලන නායකත්වයක් සමාජය තුළ විශාල ආර්ථික අසමාන තා දැකීමට කැමති නොවන අතර සමාජ සාධාරණය උදෙසා කැප විය යුතු වන්නේය. එය නාස්තිය හා දූෂණය වැලැක්වීමට කටයුතු යෙදිය යුතු වන්නේය. එය ඉතාමත්ම දුප්පත් පුද්ගලයා පවා පීඩනයට පත් නොකරන සාධාරණ බදු ක්‍රමයක් සම්පාදනය කළ යුතු වන්නේය.

- ශිෂ්ට සම්පන්න දේශපාලන නායකත්වයක් ආර්ථික අවස්ථා තම හිතවතුනට පමණක් ලබා දීමට කටයුතු නොකරන්නේය. දක්ෂතාවයට තැන දෙන, තරගකාරීත්වයට අවකාශ සලසන සාධාරණ ක්‍රමයක් ඇති කරන ප්‍රතිපත්තියක් තිබිය යුතුය. ගැත්තන්ට පමණක් අවස්ථා සලසන ක්‍රමයකින් තරුණ පරම්පරාව කලකිරීමට පත්ව සිටී. මේ "ගැති දේශපාලනය" ඔවුහු පිළිකුල් කරති.

- එමෙන්ම ශිෂ්ට සම්පන්න දේශපාලන නායකත්වයක් ජාතික අයවැයෙන් විශාල ප්‍රමාණයක් අධ්‍යාපනය, සෞඛ්‍යය, මහජන ප්‍රවාහනය හා නිවාස තැනීම සඳහාත් සමාන්‍ය ජනයාගේ ජීවන තත්වය නැංවීමට උපයෝගී වන අංශයන් සඳහාත් වෙන් කළ යුතුය.

ඉහත සඳහන් වන්නේ වෙනසක් සඳහා පුරවැසියෙකු ඉදිරිපත් කරන ඉල්ලීම් මාලාවකි. මගේ අදහස අනුව අපට මෙම මූලික අයිතීන් ලැබෙන්නේනම් අප අපේක්ෂා කරන වෙනස බිහි කොට ගැනීම සඳහා විශාල අවකාශයක් හා අවස්ථාවන් නිර්මාණය වනු ඇත. කිසිවකු මා බොළඳයයි කීමට ඉඩ තිබේ. මම ඒ පිළිබඳව අපනාප නොවෙමි. එහෙත් අප මෙරට පුරවැසියන් ලෙස කතා නොකොට සිටින්නේ නම් සහ අපට වුවමනා වෙනස ඉල්ලා නොසිටින්නේ නම් අපට සදාකාලිකව නිහඬව සිටීමට සිදු වනු ඇත.

# අපි එතනින් පටන්ගමු නංගි...



"ආ... හෂිණි නංගි. කොහෙද මේ මාර ලස්සනට ඇදලා ආ... සුරංග නාවියක් වගේනේ...? පොකට් එකට එන්නේ නැතෙයි?"

**"මොන පොකට්ද? මම ෆැන්සි හවුස් එකට යනවා ගුණේරිස් අයියේ බඩු වගයක් ගන්න. මාස තුනක මහපොල ලැබුණනේ. ඕගොල්ලන්ට ඉතිං පොකටුයි පිකටුයි ඇර මේ ලෝකේ දෙයක් නෑනේ. මට නම් පෙන්නන්න බෑ ඔය විකාර. ලෙක්චර් කීයක් කට් වෙනවද?"**

"එහෙම කියන්න එපා නංගි. අපි මේ දෙන ෆයිට් නිසා තමයි මහපොලත් කීයක් හරි වැඩිවුණේ."

**"අනේ නිකං යන්න ගුණේරිස් අයියේ යන්න. මහපොල වැඩිවුණේ ඔය විකාරවලින් වෙන්නේ කොහොමද? ජනාධිපතිතුමා අය-වැයෙන් ඒක වැඩි කළේ රටේ දරු පරපුරට අනාගතයක් හදන්න."**

"හරි...හරි... මාස තුනට කීයක් දුන්නද ජනාධිපතිතුමා? "

**"හත්දාස් පන්සීයක් දුන්නා."**

"ඇයි නංගි අය-වැයෙන් මහපොල 4000ක් කළා කියලා කිව්වනේ. කොළඹටම ගෙන්නලත් පරණ ගානමනේ දීලා තියෙන්නේ."

**"ඒක හරි මාස තුනක එකසැරේ ලැබුණනේ. ඕගොල්ලන්ගේ ඔය පිකට් පොකට් කෙරුවාවෙන් මොනවද ලැබෙන්නේ?"**

"හරි... නංගි කියන්න බලන්න ඔය මහපොල 2500/- තිහෙන් බෙදලා ජනාධිපතිතුමා ඔයාගේ විශ්වවිද්‍යාල අධ්‍යාපනය වෙනුවෙන් දවසකට රුපියල් කීයක් වෙන් කරලා දීලා තියනවාද කියලා..."

**"ම්... රුපියල් 83/-ක් විතර."**

"කැන්ටිමේ කෑම එකක් කීයද?"

**"බඩ දගලන එකක් 25/-යි. කන්න පුළුවන් මට්ටමේ එකක් රුපියල් 50/-යි."**

"ඒ කියන්නේ නංගිට දෙවේලට බත් කන්නවත් මදි ගානක් නේද ඔය ශිෂ්‍යාධාරෙ? හරි...මට කියන්න ජනාධිපතිතුමා මේ සැරේ අය-වැයෙන් දුප්පත් අපිට අමතරව වැඩි කරපු 1500/- තිහෙන් බෙදලා දවසකට කීයක් වැඩි කරලද කියලා."

**"ම්...රුපියල් පනහයි."**

"ඒ කියන්නේ ජනාධිපතිතුමා දුප්පත් විශ්වවිද්‍යාල ශිෂ්‍යයෙක් වෙනුවෙන් ශිෂ්‍යාධාරයක් විදිහට දවසකට වෙන්කරන්නේ රුපියල් 133/- යි. නංගිට ඒ මුදල ඇතිද නංගි?"

**"පිස්සුද ගුණේරිස් අයියේ. ඔයා දන්නෑ වගේ අහන්නේ. බඩ රවට්ට ගන්නත් මදි. අම්ම කුළී වැඩ කරලා එවන කීයක් හරි නැත්නම් උපාධිය පැත්තක තියලා ෆුඩ්සිටි එකක සෙල්ස් ගර්ල්වත් යන්න තමයි වෙන්නේ"**

"නංගි දන්නවද ජනාධිපතිතුමාගේ දවසක වියදම විදිහට කීයක් වෙන්කරගන්නවද කියලා?"

**"මිහු... පනස් දහක් විතර."**

"එහෙම නම් මොකද? දවසකට ජනාධිපතිතුමාගේ වියදම රුපියල් ලක්ෂ 260/-ක්."

**"බුදු අම්මෝ. එච්චර සල්ලියක්.?"**

"එතුමගේ එක දවසක වියදමෙන් උදාගම් ගෙවල් 20ක් විතර හදන්න පුළුවන් නේද? ඒවා තමයි නංගි අපි පොකට් පිකට් තියලා ඔයාලට පැහැදිලි කරලා දෙන්නේ. මේ ක්‍රමයේ වෙනසක් කරන්න ඕනේ කියලා."

**"ඉතිං අපි මොකද කරන්නේ ගුණේ අයියේ?"**

"නංගි පොකට්වලට පිකට්වලට ආවේ නැතිවට කමක් නෑ. හැබැයි මේ ක්‍රමය වෙනස් කරන්න එකතුවෙන්න ඔයාටත් පුළුවන්. ජනවාරි 8 වෙනිදට ගිහිල්ලා විධායක ජනාධිපති ක්‍රමය වෙනස් කරන්න මෛත්‍රීපාලට ඡන්දෙ දෙන්න. අපි එතනින් පටන් ගමු නංගි."



# කුක්සාස්වලින් බලය ගොඩනැඟීම






වත්මන් ලෝකයේ කැපී පෙනෙන ප්‍රපංචයන් දෙකකි. එකක් ඒකාධිපති පාලනයන්ට එරෙහි දේශපාලන පිබිදීම් මුල්කරගත් දේශපාලන අර්බුදයන්ය. අනෙක ගෝලීය ආර්ථික අර්බුදයෙන්ය.

මෙයින් දේශපාලන අර්බුධය දෙස බැලූවිට කැපී පෙනෙන කරුණ වන්නේ සිවිල් නායකයන් මෙන්ම හමුදා නායකයන්ද මහජන ඡන්දය නමැතිකැරට්අලයපෙරටුකොටගෙන මැතිවරණ පවත්වා, වංචාවෙන් ජයගෙන, ජනතාව මුලාකොට වසර කීපයකින් ප්‍රජාතන්ත්‍රවාදයේ වෙස් මුහුණු සහ සළුපිළි ගලවා ඒකාධිපති නිල ඇඳුමට බැස ඉදිරි කාලයම ඡන්දය දුන් ජනතාව මානසිකව සහ ශාරීරිකව පෙළමින් හිතුවක්කාර ලෙස තම ඒකාධිපති අභිමතාර්ථයන් සපුරා ගැනීමට කටයුතු කිරීමයි.

18 වන සහ 19 වන සියවස්වල ප්‍රජාතන්ත්‍රවාදය සහ ඒකාධිපතිවාදය බොහෝවිට නිර්වචනය වූයේ එකිනෙකට පරස්පර පාලන තන්ත්‍ර දෙකක් ලෙසටය. වර්ථමානයේ වුවද නිර්වචනයන් ප්‍රකට වන්නේ එලෙසිනි. එහෙත් භාවිතය තුළ දක්නට ඇත්තේ ඒ දෙකෙහි ඥාතිත්වය, අනොන්‍යා සහසම්බන්ධය සහ සහජීවනයයි.

ඒකාධිපතියකු වීමේ ඒකායන මාර්ගය මහජන ඡන්දය බව කපටි පාලකයෝ දනිති. ප්‍රජාතන්ත්‍රවාදී ආභරණයෙන් සැරසී අප ඉදිරියට සිනාසෙමින් එන මොවුන් ඒකාධිපතිත්වයට නැගිය හැකි ප්‍රජාතන්ත්‍රවාදය නමැති ඉණිමගට අහිංසක ලෙස ගොඩවෙති. සටකපට සහ මංග පිළිවෙත් හරහා දිනති. සාමය අවශ්‍ය තැනදී සාමයෙන්ද ප්‍රචණ්ඩත්වය අවශ්‍ය තැනදී ප්‍රචණ්ඩත්වයෙන්ද සිය අභිලාෂය ඉටු කර ගනිති. කෙටියෙන් කියතොත් කෙක්කෙන් හෝ කොක්කෙන් ගෙඩිය කඩා ගනිති.

අද ලෝකය පුරා ඇත්තේ ප්‍රජාතන්ත්‍රවාදයක් නොව ප්‍රජාතන්ත්‍රවාදී ඒකාධිපතිවාදයකි. (democratic-dictatorship). එම යෙදුම පරස්පරයක් (contradiction) හෝ විරෝධෝක්තියක් (oxymoron) ලෙස පෙනිය හැකිය. ඉතිහාසය තුළ එසේ වූ නමුත් අද එය එසේ නොවේ. භාවිතය විසින් පරස්පරය දියකර ඇත.

මුසෝලිනි, හිට්ලර්, කවුන්ඩා, ගුමා, කිම් ඉල් සුං, මුගාබේ, ඉඩි අමීන්, මෙන්ජෙස්ටු සහ පොල්පොට් ආදී නායකයන් බොහොමයක්ම එක්කෝ කුමන්ත්‍රණ හරහා නැත්නම් මහජන ඡන්දයෙන් පත්ව පසුව ඒකාධිපතියන් බවට පත්වූවන්ය. 2010 වසරේ බලයට පත්වූ යුක්රේනයේ වික්ටර් යානු (සහ ශ්‍රී ලංකාවේ මහින්ද රාජපක්ෂ) මින් වෙනස් වූවෙකු නොවේ.

**යානු සහ යුක්රේනය**

ආර්ථික උද්ධමනය, විරැකියාව, ඌන සංවර්ධනය, සෞඛ්‍ය සහ අධ්‍යාපන සහන කප්පාදු සහ නිදහස වළලා දැමීම ආදියට යුක්රේනයද නොඅඩුව මුහුණ දුන් රාජ්‍යයකි. යුක්රේනයෙහි හතරවෙනි ජනාධිපති ධුරයට 2010 වසරේදී මහජන ඡන්දයෙන් පත්වනුයේ සොරකමකට සහ පුද්ගල පහරදීම් කිහිපයක් සඳහා දඬුවම් විඳ පසුව දේශපාලනයට පිවිස ඉන් ඉහළට පැමිණි යානුය.

බලයට පැමිණ වසරක් ඇතුළත යානු ඒකාධිපති භූමිකාවට ඇතුල්වුණි. එහි ප්‍රතිපලයක් ලෙස යානුට එරෙහිව සමාජ බලවේගයන් දියත්වීම නිසා වසර හතරක් ඇවෑමෙන් ඔහු බලයෙන් ඉවත් කෙරිණි. ඔහුගේ යුක්රේන් පාලන සමය අත්තනෝමතික සහ ඒකාධිපතිවීම ඊට හේතු විය. යානුගේ ඒකාධිපති වියරුව නැවතුනේ යුක්රේනය රුසියාවේ සරණාගතයකු තත්ත්වයට පත්කරමිනි.

යානුගේ පක්ෂය වූයේ The Party of Regions ය. ඔහු සිය පක්ෂයේ බලය 'කුක්සාස්'වලින් ගොඩනගා ගෙන තිබිණ. 'කුක්සාස්' යනු Carcass යන ඉංග්‍රීසි වචනයට සමාන අර්ථය ඇති වචනයකි. වෙනත් පක්ෂවලින් පැන ආ හෝ තම බලය තහවුරු කරගැනීම පිණිස යානු විසින් විවිධ වරදාන සහ වරප්‍රසාද ප්‍රදානයෙන් උපක්‍රමශීලීව ඩැහැගත් මන්ත්‍රීවරුන් හැඳින්වූයේ එලෙසිනි.

ඒ අනුව යානුගේ පක්ෂය බලවත් වූයේ වෙනත් පක්ෂයන්හි "සත්ත්ව මළකුණු" වලිනි. ජනාධිපති මහින්ද රාජපක්ෂ තුනෙන් දෙකක බලයක් ඒකරාශි කරගත්තේද 'කුක්සාස්'වලිනි. ඒ යානුට ප්‍රථමයෙනි. එසේ වුවද දෙදෙනාගේම විධි ක්‍රමය සමානය. දෙදෙනාම රැස්කරගත් සියළු බලය භාවිත කළේ දූෂණය පෝෂණයට, ඒකාධිපතිත්වයට පාර කපා ගැනීම සහ මහජන බදු මුදල්වලින් අති සුපිරි ජීවිත ගත කිරීමටය.

**"තත්ත්වය ඉතා කණගාටුදායකය. දූෂණය ඉහ වහා ගොසිනි. යුක්රේන්වල ජනතාවගේ එකම ප්‍රශ්ණය අන් කවරෙකුවත් නොව ඒකාධිපති යානු සහ ඔහුගේ දූෂිත ඇමැති මණ්ඩලය සහ නිලධාරි සගයන්ය. පාරදෘෂ්‍යභාවය පිළිබඳ ජාත්‍යන්තර සූචියට අනුව ගෝලීය දූෂණ ලැයිස්තුවේ යුක්රේනය සිටිනුයේ 144 වන ස්ථානයේය.**

සුපිරි පහසුකම් සහිත යානුගේ පෞද්ගලික නිවාසය නඩත්තු වූයේ මිලියන ගණන් මහජන මුදල් වැය කිරීමෙනි. සිය සුඛ විහරණයට මහජන මුදල් අනුකම්පා විරහිතව අත දිග හැර වියදම් කිරීමට යානු දෙවරක් සිතුවේ නැත. ඒ රටේ ජනතාවගෙන් සැළකිය යුතු ප්‍රමාණයක් සතර අපා දුක් විඳිද්දීය. යුක්රේනුවන් පරම්පරා ගණනාවක් විදේශීය ණය බැඳුම්කරවල සිරකර තබමිනි.

යානුට එරෙහිව යුක්රේන ජනතාවාදී සංවිධානයෙන් යූලියා ටයිමෙසෙන් කෝචා තරඟ වැදුණි. යානු සමඟ තරඟ වැදීමේ පාපයට ඇය බොරු චෝදනා රැසකට වරදකාරිය කර වසර හතකට බන්ධනාගාර ගත කෙරිණ.

එහෙත් යූලියා වරදක් කර නොතිබූ නිසා වසර දෙක හමාරකට පසු ඇ නිදහස් කිරීමට යානුට සිදුවිය. එහිදී යානු පෙන්වාදුන්නේ ඒකාධිපතිත්වයට පොදු ලක්ෂණයකි. එනම් පලිගැනීමය.

යානුගේ බල අධිකාරියේ බිඳවැටීම ආරම්භ වූයේ යූලියාගෙන් පලිගැනීමට එරෙහිව ජනතා උද්ඝෝෂණ ඇතිවීමත් සමගිනි. උද්ඝෝෂණ ඇරඹී දින හතරක් තුළදී යානුගේ හමුදාව උද්ඝෝෂකයන් 82 ක් ඝාතනය කළේය. රටේ ජනාධිපතිවරයා ලෙස එම මරණ පිළිබඳ පිළිගත හැකි පරීක්ෂණ වාර්තාවක් ජනතාව අතට පත් නොකිරීම නිසා යානුට එරෙහි උද්ඝෝෂණ කැරැල්ලක් බවට පත්විය. අවසානයේ යානුට ඒකාධිපති පාලනය තවදුරටත් පවත්වාගෙන යාමට නොහැකි තත්ත්වයක් උදාවිය. යුක්රේන පාර්ලිමේන්තුව සහ කැබිනට් මණ්ඩලයේද අනුමැතියෙන් 2012 වසරේදී ඔහු බලයෙන් පහකරන ලදි.

යානු ඉවත් කිරීමෙන් මාස හයකට පසු ඔහුගේ පාලන සමය පිළිබඳ වාර්තාවක් ඉදිරිපත් කෙරිණ. ඒ යුක්රේන් ප්‍රජාතන්ත්‍රවාදී සංවිධානයේ ජාත්‍යන්තර ලේකම්වරිය වූ ඇලීසා රුබන් විසිනි. එම වාර්තාවෙන් ඇය පෙන්වා දෙනු ලැබුවේ ප්‍රජාතන්ත්‍රවාදයෙන් බලයට පත්වන්නන් ව්‍යවස්ථා විරෝධීව ක්‍රියා කරමින් වියරු ඒකාධිපතිත්වයක් කරා යන බවත් මෙවන් ඒකාධිපතියන් අවසානයේ මහජන බලය ඉදිරියේ විනාශවී යන බවත්ය. ඇගේ නිගමනය යුක්රේනය ගැන වුවද බොහෝ රටවල ඒකාධිපතියන්ගේ ඉරණම මෙය වූ බව අපි දනිමු.

යානුගේ සිව් වසරක පාලන සමය තුළ යුක්රේනයේ තත්ත්වය සහ ඔහුගේ දේශපාලන හැසිරීම පිළිබඳව ඇලිසා රුබන්ගේ වාර්තාවෙන් අවධාරණය වූ අදහස් පොදුවේ ඒකාධිපතිවයේ රූපයත් විශේෂයෙන් ඒකාධිපතියන්ගේ භූමිකාවකත් කදිමට කියාපායි. එම වාර්තාවේ සාරාංශය මෙසේය.

"තත්ත්වය ඉතා කණගාටුදායකය. දූෂණය ඉහ වහා ගොසිනි. යුක්රේන්වල ජනතාවගේ එකම ප්‍රශ්ණය අන් කවරෙකුවත් නොව ඒකාධිපති යානු සහ ඔහුගේ දූෂිත ඇමැති මණ්ඩලය සහ නිලධාරි සගයන්ය. පාරදෘෂ්‍යභාවය පිළිබඳ ජාත්‍යන්තර සූචියට අනුව ගෝලීය දූෂණ ලැයිස්තුවේ යුක්රේනය සිටිනුයේ 144 වන ස්ථානයේය.

මානව නිදහස ඉතා සීඝ්‍රයෙන් උල්ලංඝනය වෙමින් පවතී. ස්වාධීන අධිකරණයක් නොමැත. රටේ විනිශ්චයකාරවරුන් ඇතුළු සියළු වැදගත් තනතුරුවලට නිලධාරින් පත් කරනුයේ ඔහු විසිනි. රාජ්‍ය පාලනය යානුකොවිච් සිය පුතුන් දෙදෙනාද සහෝදරයන් සහ සමීපතම පවුල මත පමණක් රඳවා ඇත. සුදුසුකම් රහිත හිතවතුන් රජයේ ඉහළ තනතුරුවලට පත්කර ඇත.

රට ප්‍රජාතන්ත්‍රවාදයට හැරෙන ප්‍රවණතාවය සැබැවට අඩපන කිරීමට කටයුතු කරන අතර ප්‍රෝඩාවට ප්‍රජාතන්ත්‍රවාදය මැතිරීම සහ රඟපෑම රටට ප්‍රජාතන්ත්‍රවාදය රැගෙන ඒමට සහ රට දූෂණයෙන් සහ ඒකාධිපති උවදුරින් මුදවාගැනීමට පෙළ ගැසුණු 'යුක්රේන් ප්‍රජාතන්ත්‍රවාදී සංවිධානය' නමැති පක්ෂයට මැතිවරණයට ඉදිරිපත් වීම වැළැක්වීම, ව්‍යවස්ථාව වෙනස් කිරීම සඳහා නීතිමය ප්‍රතිපාදන සකස් කිරීම, ඒ සඳහා තමන් පත්කරන ලද අධිකරණයෙන්ම නීතිමය ආවරණය ලබාගැනීම, රාජ්‍ය බලය අධම සහ අයුතු ලෙස අවභාවිත කිරීම, පාර්ලිමේන්තුව සමඟ සම්බන්ද නොවීම, මහජන බදු මුදලින් සිය මැතිවරණ ව්‍යාපාර කරගෙනයාම, විරුද්ධ පාක්ෂිකයන් මර්ධනය, මැතිවරණ නීති නොසළකා හැරීම, පවුලේ අයට සහ මැති ඇමැතිවරුන්ට රටේ සම්පත් ගසා කෑමට ආවරණය සැළසීම, හේතුවෙන් 'යුක්රේනයේ හොරා' යන නම ද යානුට පටබැඳිණ."

යානු ධුරයෙන් නෙරපා හරින විට රාජ්‍ය භාණ්ඩාගාරයේ ඉතිරිව තිබුණේ ඇමරිකානු ඩොලර් මිලියන 430ක් තරම් සොච්චම් මුදලකි. යානුගේ පෞද්ගලික වත්කම ඩොලර් බිලියන 4ක් විය. ඔහුගේ පවුලේ සාමාජිකයන්ගේ වත්කම් අනාවරණය වී නොමැත. යානුගේ පාලන කාලයේදී ඩොලර් බිලියන 37ක් අතුරුදහන්වී තිබේ. තවත් ඩොලර් බිලියන 70ක් රටින් බැහැර කොට තිබේ.

**මහාචාර්ය ඩෙස්මන්ඩ් මල්ලවාරච්චි**

මහාචාර්ය විජය කුමාර්



**අද ලංකා සමසමාජ පක්ෂය, තවදුරටත් එන්.එම්. පෙරේරාගේ හෝ කොල්වින් ආර්. ද සිල්වාගේ හෝ බර්නාඩ් සොයිසාගේ හෝ සමසමාජ පක්ෂය නොවේ. ඒ වෙනුවට, 2010 සිට අපට ලැබී ඇත්තේ, ජනාධිපතිවරයාගේ අභිලාෂයන් සතපවන පරිද්දෙන් ප්‍රතිපත්තිමය තීන්දු තීරණ ගැනෙන, ස්වාධීන මතිමතාන්තරවලින් තොර සමසමාජ පක්ෂයකි.**

# ලංකා සමසමාජ පක්ෂය: 79 වැනි සංවත්සරය ද නැත්නම් 4 වැනි සංවත්සරය ද?

ලංකාවේ පැරණිතම දේශපාලන පක්ෂය වන ලංකා සමසමාජ පක්ෂයේ 79 වැනි සංවත්සරය යෙදෙන්නේ දෙසැම්බර් 18 වැනි දාටයි. එන්. එම්. පෙරේරා, කොල්වින් ආර් ද සිල්වා, ලෙස්ලි ගුණවර්ධන සහ බර්නාඩ් සොයිසා වැන්නන්ගේ ලංකා සමසමාජ පක්ෂය අධිරාජ්‍ය-විරෝධී අරගලය තුළ ප්‍රධාන භූමිකාවක් රඟපෑවා පමණක් නොව, අද කම්කරු පංතියත් ලංකාවේ පොදු ජනතාවත් භුක්ති විඳින බොහෝ ප්‍රතිලාභ සාධනය කර දීම සම්බන්ධයෙන් ද ප්‍රමුඛත්වයක් ගත්තේය. ඒවායින් බොහොමයක් අද වන විට දියාරු කොට තිබේ. එදා සිට බලයට පත්වූ බොහෝ ආණ්ඩු, ලෝක බැංකුවේ සහ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ උපදෙස් මත, සාමාන්‍ය ජනතාව වෙත කාන්දු නොවන ආර්ථික එල්ලයන් පසුපස ගොස් සාමාන්‍ය ජනතාවගේ ජීවන තත්වය නගා සිටුවීම අයාලේ යවා තිබේ. වැඩ වර්ජනය කිරීමට සහ විරෝධය පෑමට ඇති අයිතිය මහජනයාට කරදරයක් වන්නේය යන කුතර්කය මත පිහිටා, පොලීසිය සහ අධිකරණය හරහා බොහෝ විට අද ඒවා මර්දනය කෙරේ. එදා අප භුක්ති වින්ද නිදහස් අධ්‍යාපනය සඳහා ප්‍රමාණවත් ප්‍රතිපාදන වෙන් නොකිරීමෙන් අධ්‍යාපනයේ වර්ධනය සහ ග්‍රාමීය දිළිඳු දරුවන්ගේ අනාගත අපේක්ෂා ව්‍යර්ථ කෙරී ඇති අතර, ඒ වෙනුවට, ''ජාත්‍යන්තර පාසල්'' ද, ආණ්ඩුවේ මැදිහත්වීමෙන් ගොඩනැගෙන පෞද්ගලික විශ්ව විද්‍යාල ද ඉදිරියට විත් තිබේ. එසේම, නිදහස් සෞඛ්‍ය සේවාවත් ක්‍රම ක්‍රමයෙන් පෞද්ගලීකරණයට යටත් කෙරෙමින් තිබේ.

ප්‍රජාතන්ත්‍රවාදී ප්‍රතිපත්ති කෙරෙහි දක්වූ බැඳීමත්, සමාජයීය වශයෙන් වැදගත් අරගලවලට උරදීමත්, කම්කරු පංති-විරෝධී සහ ජනතා-විරෝධී ප්‍රතිපත්තිවලට එරෙහිව නැගී සිටීමත්, විශේෂයෙන් එම පක්ෂයේ නායකයන් සතු වූ අදූෂිත සහ සුපිළිපන් චරිත ස්වභාවයත් නිසා වැඩ කරන ජනතාවගේ විශ්වාසයත්, පොදු ජනතාවගේ ගෞරවයත් එදා එම පක්ෂයට හිමි විය. එම පක්ෂය එදා ගත් ප්‍රතිපත්තිමය ස්ථාවරයන් හේතු කොටගෙන, මේ රටේ වෙසෙන බුද්ධිමය ප්‍රජාවත්, උගත් තරුණ පරම්පරාවත් එම පක්ෂය සමග එදා අනන්‍ය වූහ. විධායක ජනාධිපති ක්‍රමය තුළ පවතින අත්තනෝමතික ස්වරූපය ගැන මුලින්ම රටේ අවධානය යොමු කෙළේ එන්. එම්. පෙරේරා ය. 1978 ව්‍යවස්ථාව මගින් ශ්‍රී ලංකා රාජ්‍යයේ ප්‍රජාතන්ත්‍රීය භාවයට එල්ල කෙරෙන අවදානම

ඔහු පෙන්වා දුන්නේය. එනිසා විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කෙරෙන සහ පාර්ලිමේන්තුවට යළි බලය පවරන නව ව්‍යවස්ථාවක් සම්පාදනය කර ගැනීම එකම ගැලවුම

**අවසාන වාර්තාවක් සකස් කිරීම සඳහා 'සර්ව පාක්ෂික නියෝජිත සමුළුව' සහ තිස්ස විතාරණ ගත් ප්‍රයත්නයන් ගඟට කැපූ ඉණි හා සමාන විය. මන්ද යත්, එල්.ටී.ටී.ඊ. සංවිධානය හමුදාමය වශයෙන් පැරදවීමෙන් පසු තවදුරටත් ජාතික ප්‍රශ්නයට දේශපාලන විසඳුමක් අවශ්‍ය නැතැ යි ආණ්ඩුව සිතන්නට වීම නිසා ය. 'සර්ව පාක්ෂික සමුළුවේ' නිර්දේශ නොතකා හැරියා පමණක් නොව, ගඟෙන් වැටුණු එකාට ගොනා ඇන්නා සේ, ගිය වසරේ එවැනිම පරමාර්ථයක් වෙනුවෙන් යැයි කියා පත්කරන ලද පාර්ලිමේන්තු තේරීම් කාරක සභාවට තිස්ස විතාරණව සාමාජිකයෙකු වශයෙන් පත් නොකිරීමටත් ආණ්ඩුව වගබලාගත්තේය.**

වන බව ඔහු එදා කීය. දැන් මුළු රටම එම අදහස පිළිගනී.

එසේ වෙතත්, සෑම ප්‍රතිපත්තිමය කාරණයකදීම කෙලින් සිට ගත් ඒ අතීත පක්ෂයේ වර්තමාන නායකත්වය හොබවන පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් දෙන්නා පක්ෂයේ තීරණයටත් පටහැනිව යමින්, 2010 සැප්තැම්බර් මාසයේදී 18 වැනි ව්‍යවස්ථා සංශෝධනයට පක්ෂව ඡන්දය පාවිච්චි කරමින් වැරදි මාවතකට පිළිපන්හ. මේ සංශෝධනයට පක්ෂව ශ්‍රී ලංකාවේ කොමියුනිස්ට් පක්ෂයත් ඡන්දය පාවිච්චි කළ ද, තමන්ගේ එම තීරණය වැරදි බව පසුව පිළිගත් එම පක්ෂය ඒ වෙනුවෙන් ජනතාවගෙන් සමාව අයැද සිටියේය. ලංකා සමසමාජ පක්ෂය අද වන තෙක් එවැන්නක් කෙළේ නැත. 2012 දෙසැම්බර් මාසයේදී නැවතත් පක්ෂ තීරණයට එරෙහිව යමින්, එම මන්ත්‍රීවරුන් දෙන්නාගෙන් එක් කෙනෙක් අගවිනිසුරු ශිරානි බණ්ඩාරනායකට එරෙහි දෝෂාභියෝග යෝජනාවටත් පක්ෂව ඡන්දය පාවිච්චි කෙළේය.

ජනාධිපතිවරයාගේ ඉල්ලීමට අවනත වනු වස් මෙසේ නිර්ලජ්ජී ආකාරයෙන් පක්ෂ විනය මේ මන්ත්‍රීවරුන් විසින් කඩකරන ලද්දේ වී නමුත් පෙරළා ඒ වෙනුවෙන් පක්ෂයට අත්වූ සුගතියක් ද නැත. ''ජාතික ප්‍රශ්නය විසඳා ගැනීම සඳහා වන පුළුල් එළැඹුමක්'' සහිත, ''දේශයට උචිත නව ව්‍යවස්ථාවක්'' සම්පාදනය කර ගැනීම සඳහා වූ 'සර්ව පාක්ෂික නියෝජිත සමුළුවේ' නායකත්වය දැරුවේ සමසමාජ පක්ෂයේ වර්තමාන ලේකම් තිස්ස විතාරණයි. මේ 'සර්ව පාක්ෂික නියෝජිත සමුළුව' 2006 සිට 2009 දක්වා රැස්වුණි. තිස්ස විතාරණගේත්, එම සමුළුවේ සෙසු සාමාජිකයන්ගේත් අධිෂ්ඨානය සහ කැපවීම හරහා, ජාතික ප්‍රශ්නයට විසඳුමක් විය හැකි අවසාන වාර්තාවක් පිළියෙල කෙරුණි. 2009 අගෝස්තු මාසයේදී එම වාර්තාව ජනාධිපතිවරයාට භාර දුන්නද, ඒ ගැන මේ දක්වා කිසි පියවරක් නොගෙන ඇතිවා පමණක් නොව, එවැනි වාර්තාවක් තමන්ට අතට පත්විණි ද යන කුකුසක් පවා ජනාධිපති ලේකම් කාර්යාලයේ ඇතැම් ප්‍රකාශ හරහා මතු කොට ඇත. ඊට පෙර 2008 ජනවාරි මාසයේදී, ව්‍යවස්ථාමය සංශෝධනවලින් තොරව ක්‍රියාත්මක කළ හැකි අන්තර්කාලීන වාර්තාවක් ඉදිරිපත් කරන්නැ යි 'සර්ව පාක්ෂික නියෝජිත සමුළුවෙන්' ඉල්ලා සිටින ලදුව, 13 වැනි ව්‍යවස්ථා සංශෝධනය හැකි තාක් දුරට ක්‍රියාත්මක කරන්නැ



යි ඉල්ලා එම සමුළුව අන්තර්කාලීන යෝජනාවක් ඉදිරිපත් කෙළේය. එහිදී ජනාධිපතිවරයා කෙළේ මේ අන්තර්කාලීන වාර්තාවට ඉහළම ප්‍රචාරය ගෙන දෙමින්, තමන් විසින් ඇතැම් ක්‍රියාමාර්ග ගනිමින් සිටින බව අන්තර්ජාතිකයට ඒත්තුගැන්වීමට බැලීම පමණි.

කෙසේ වෙතත්, අවසාන වාර්තාවක් සකස් කිරීම සඳහා 'සර්ව පාක්ෂික නියෝජිත සමුළුව' සහ තිස්ස විතාරණ ගත් ප්‍රයත්නයන් ගඟට කැපූ ඉණි හා සමාන විය. මන්ද යත්, එල්.ටී.ටී.ඊ. සංවිධානය හමුදාමය වශයෙන් පැරදවීමෙන් පසු තවදුරටත් ජාතික ප්‍රශ්නයට දේශපාලන විසඳුමක් අවශ්‍ය නැතැ යි ආණ්ඩුව සිතන්නට වීම නිසා ය. 'සර්ව පාක්ෂික සමුළුවේ' නිර්දේශ නොතකා හැරියා පමණක් නොව, ගඟෙන් වැටුණු එකාට ගොනා ඇන්නා සේ, ගිය වසරේ එවැනිම පරමාර්ථයක් වෙනුවෙන් යැයි කියා පත්කරන ලද පාර්ලිමේන්තු තේරීම් කාරක සභාවට තිස්ස විතාරණව සාමාජිකයෙකු වශයෙන් පත් නොකිරීමටත් ආණ්ඩුව වගබලාගත්තේය. එපමණක්ද නොවේ. 2010 නොවැම්බර් මාසයේදී එවකට විද්‍යා හා තාක්ෂණ කටයුතු ඇමතිවරයා වශයෙන් සිටි තිස්ස විතාරණව, අනතුරුව විද්‍යා කටයුතු පිළිබඳ බල රහිත 'ජ්‍යෙෂ්ඨ ඇමති ධුරයකට' පහත හෙළුවේය. එදා පත්කරන ලද 'ජ්‍යෙෂ්ඨ ඇමතිවරුන්' 10 දෙනාගෙන් කිසිවෙකුට දෙපාර්තමේන්තුවක්වත්, ආයතනයක්වත් භාර නොකෙරුණි. කොල්ලුපිටියේ පිහිටි තෙමහල් ගොඩනැගිල්ලක කාර්යාල කාමර අටවාගෙන, අමාත්‍යාංශ ලේකම්වරුන් දෙදෙනෙකුගේ සේවය බෙදාහදා ගැනීමට ඔවුන්ට සිදුවිය. මේ අවමානය ලංකා සමසමාජ පක්ෂය විරෝධයකින් තොරව විඳගත්තේය. මේ තත්වය 1975 දී සභාග ආණ්ඩුවේ සිටි ලංකා සමසමාජ පක්ෂය ගත් ස්ථාවරයත් සමග සසඳා බලන්න. එදා එම ආණ්ඩුවේ සිටි ලංකා සමසමාජ පක්ෂ ඇමතිවරුන් තිදෙනාගෙන් කෙනෙකු වූ ආචාර්ය එන්. එම්. පෙරේරාට ඔහුගේ ප්‍රතිපත්ති නිසා රටේ ධනපති පංතියට රිදෙමින් ඇති තත්වය තුළ මුදල් අමාත්‍යාංශය අතහැර වෙළඳ හා වාණිජ කටයුතු අමාත්‍යාංශය භාරගන්නැ යි අගමැති සිරිමා බණ්ඩාරනායක මැතිණිය ඉල්ලා සිටි අවස්ථාවේ. ඊට බලවත් විරෝධය පාමින් පක්ෂයක් වශයෙන් ලංකා සමසමාජ පක්ෂය ආණ්ඩුවෙන් එළියට ආවේය.

මේ අවුරුද්ද මුල් භාගයේදී, විධායක ජනාධිපති ක්‍රමය පිළිබඳ එන්. එම්. පෙරේරාගේ ස්ථාවරය යළි පණගන්වමින් යෝජනාවක් සම්මත කර ගත් ලංකා සමසමාජ පක්ෂය, තවත් ජනාධිපතිවරණ නොපැවැත්විය යුතු බව කියා සිටිමින්, පාර්ලිමේන්තු පාලන ක්‍රමයක් සඳහා වන ව්‍යවස්ථා සංශෝධනයක් ඇති කරන ලෙස ජනාධිපතිවරයාගෙන් ඉල්ලා සිටියේය. 2014 මැයි දවසේ, පක්ෂයේ ප්‍රධාන සටන් පාඨය වුණේ එයයි. එතැන් සිට එක දිගටම පක්ෂයේ ස්ථාවරය වුණේ ද එයයි. කෙසේ වෙතත්, මේ වසරේ ඔක්තෝබර් මාසයේදී, පක්ෂයේ අනාගත ප්‍රතිපත්ති පිළිබඳ ලේඛන තුනක් ගැන සාකච්ඡා කිරීම සඳහා රැස්වූ මධ්‍යම කාරක සභාවට, ඒ වන විට පූර්ව දැනුම් දීමක් කොට නොතිබුණු තවත් යෝජනාවක් රාත්‍රියේදී ඉදිරිපත් කෙරුණි. සභාපතිවරයා විසින් හදිසියේ කියවන ලද මේ යෝජනාව වුණේ, එළැඹෙන ජනාධිපතිවරණයේදී ලංකා සමසමාජ පක්ෂය මහින්ද රාජපක්ෂට සහයෝගය දැක්විය යුතු බවයි. ඒ වන විට ජනාධිපතිවරණයක් පැවැත්වීම ගැනවත්, ඊට ඉදිරිපත් කෙරෙන අපේක්ෂකයා ගැන කිසිදු නිල ප්‍රකාශයක්වත් ප්‍රසිද්ධියට පත්කොට නොතිබුණ ද, තවත් ජනාධිපතිවරණයක් පවා නොපැවැත්විය යුතු බවට ඊට කලින් පක්ෂය විසින් ගෙන තිබූ තීන්දුවටත් පටහැනිව යමින්, මේ කියන අප්‍රකාශිත ජනාධිපතිවරණයේ අප්‍රකාශිත අපේක්ෂකයාට සහාය පළකිරීමේ ඉහත කී යෝජනාව කඩිමුඩියේ

16 පිටුවට..........

# කලාවේ සමාජ වගකීම

මයිකල් ප්‍රනාන්දු



කලාවේ මූලික අරමුණ මිනිසාට ආස්වාදය ලබා දීම වුව ද මිනිසාගේ අනෙකුත් ක්‍රියාකාරකම් කෙරහි කලාවේ බලපෑම පිලිබඳව ඈත අතීතයේ පටන්ම කලාකරුවන්ගේ, විචාරකයින්ගේ මෙන්ම දාර්ශනිකයින්ගේ ද අවධානය යොමු වූ බැව් පෙනේ. ක්‍රි.පූ 429-347 අවධියේ ජීවත් වූ සුප්‍රකට ග්‍රීක කවියකු මෙන්ම දාර්ශනිකයෙකු ද වූ ප්ලේටෝ කලාවට සමාජය කෙරෙහි දැඩි බලපෑමක් කිරීමට ඇති හැකියාව සිය "ජනරජය" ග්‍රන්ථයේ දීර්ඝ වශයෙන් සාකච්ඡා කොට ඇත. කලාවෙන් විශේෂයෙන් කාව්‍යයෙන් හා නාට්‍යයෙන් සමාජයට වන යහපත ද පිළිගන්නා ප්ලේටෝ එයින් සමාජයට විය හැකි හානිය නිසා තම පරමාදර්ශී ජනරජයෙන් කාව්‍යය නෙරපා හැරිය යුතුයයි ද යෝජනා කොට ඇත.

මෙහි දී වැදගත් වන්නේ වර්තමානයේ දී ද ප්ලේටෝගේ මතය පිළිගත හැකි ද නැද්ද යන්නට වඩා කලාවට රටක සමාජ-දේශපාලන ක්‍රියාකාරකම් කෙරෙහි බල පැම් කළ හැකි ප්‍රමාණය පිලිබඳ ඔහුගේ නිරීක්ෂණයයි.

ක්‍රි.පූ. තුන්වන සියවස හා ක්‍රි.ව. තුන් වන සිය වස අවධියේ ඉන්දියාවේ විසූ භරත මුනිවරයා විසින් රචනා කරන ලදැයි සැලකෙන "නාට්‍ය ශාස්ත්‍ර" ග්‍රන්ථයේ නාට්‍ය කලාවේ ආරම්භය පිළිබඳ පුවතින් ද හෙළි වන්නේ නාට්‍යය වැනි කලාවක ආස්වාද ජනනයේ මෙන්ම සමාජය කෙරෙහි බලපෑමේ හැකියාව පිළිබඳව විචාරකයන් තුළ වූ විශ්වාසයයි. එම වෘතාන්තය අනුව නාට්‍ය කලාවෙන් අපේක්ෂා කරන ලද්දේ කාමයෙහි හා ලොභයෙහි වසඟයට ගිය ලෝකය අශ්ලීල ගති පැවතුමෙන් යුතුව, ඊර්ෂ්‍යා ක්‍රොධාදියෙන් මුළාව දුක සැප මුසුව පවතිද්දී ඒවායින් මිදීමේ හැකියාව ලබා දෙන ශ්‍රව්‍ය දෘශ්‍ය ගෝචර වූ විනෝද ක්‍රීඩාවක් සම්පාදනය කොට දීමය.

කලාවේ ඇති ආස්වාද ජනන හැකියාව සහ සමාජය කෙරෙහි බලපෑමේ හැකියාව යන යන දෙපාර්ශ්වයම කෙරෙහි කලාකරුවනගෙ හා කලා විචාරකයිනගේ පමණක් නොව දාර්ශනිකයන්ගේ ආගමික නායකයින්ගේ මෙන්ම දේශපාලන නායකයින්ගේද අවධානය ඉතිහාසය පුරා යොමු වී ඇත.

මේ තත්වය නිසා කලා ක්ෂේත්‍රයෙහි ප්‍රධාන ප්‍රවාහයන් කිහිපයක් වරින්වර පැන නැගෙනු දැකිය හැකිය. එක් ප්‍රවණතාවයක් වන්නේ කලා කරුවා තමාට සමාජය කෙරෙහි බලපෑම් කිරීමට ඇති හැකියාව පිළිබඳවද දැනුවත්ව එහෙත් ආස්වාද ජනන අරමුණ ප්‍රමුඛස්ථානයෙහි තබාගෙන නිර්මාණ කාර්යයෙහි යෙදීමයි. කලාවෙහි ප්‍රධාන අරමුණ ආස්වාද ජනනයයයි විශ්වාස කළ සමහර සංස්කෘත විචාරකයෝ ඒ මගින් සමාජයට කිසියම් උපදෙසක් දීමේ හැකියාව ද උපයෝගී කොට ගත හැකියයි පිළිගත් බව පෙනේ. එකොළොස් වන සියවසේ ජීවත් වූ කාෂ්මීර විචාරක මම්මට ආචාර්යවරයා කලාවෙන් (කාව්‍යයෙන්) දෙන උපදේශය හඳුන්වා ඇත්තේ "කාන්තා සම්මිත උපදේශ"යක් ලෙසිනි.

මෙම සංකල්පය පිළිබඳව කරන විග්‍රහය දෙස බලන ට පැහැදිලි වන්නේ කලාවෙන් උපදේශයක් ලැබීම කිසියම් තත්වයක් තමා ඉදිරි පිට ගෙන හැර දක්වෙන විට එය අත් දැකීමෙන් කිසිවකු විසින් ලබන අවබෝධය තුළින් හට ගන්නක් බවයි.

මෙම ලිපියේ දී විශේෂ අවධානය යොමු වන්නේ සාහිත්‍යය, නාට්‍යය හෝ සිනමාව වැනි මිනිස් සමාජය හා පුද්ගල චරිත විෂය කොට ගෙන නිරිමාණය වන කලාවන් හා එබඳු නිර්මාණයන්හි යෙදෙන කලා කරුවන් පිළිබඳවය.

මෙබඳු කලාවන්ගෙන් ඒවා ඒවා පරිහරණය කරන්නවුන්හට සංකීර්ණ ආස්වාදයක් ලබා දීමේ ප්‍රධානම සාධකය වන්නේ තමා ඉදිරියේ මැවෙන සිද්ධීන් හා චරිතයන් දෙස ඒවා කෙරෙහි ආසක්ත නොවී නිරීක්ෂණය කිරීමට හැකියාව ලබා දීම තුළින්ය යනු මෙම ලේඛකයාගේ ස්ථාවරයයි. මෙම ස්ථාවරයට එරෙහි තවත් මතයක් තිබේ. ඒ අනුව කිසියම් කලාකෘතියක එන චරිත හා සිද්ධීන් සමග පාඨකයා හෝ ප්‍රේක්ෂකයාට අනන්‍ය වීමට සැලැස්වීම තුළින් ආසක්ත කිරීම ආස්වාදනයේ ප්‍රධාන සාධකය බවයි.

මේ මත දෙකම වසර දහස් ගණනක් තිස්සේ පෙරපර දෙදිග කලා ලෝකයේ වර්ධනය වූ ඒවාය. ප්‍රේක්ෂකයා හෝ පාඨකයා කලා කෘතියේ එන චරිත හා සිද්ධීන් සමග අනන්‍ය වීම තුළින් ඔහුට හෝ ඇයට ආස්වාදයක් ලැබෙන්නේය යන මතය පැරණි ග්‍රීසියේ හට ගෙන ඇරිස්ටොටල් පඬිවරයා විසින් තහවුරු කරනු ලැබ බටහිර කලා ලෝකයේ ප්‍රචලිත වූවකි.

කලාකෘතියක අන්තර්ගත සිද්ධීන් හා චරිතයන් ඒවා කෙරෙහි ආසක්ත වීමකින් තොරව නිරීක්ෂණය කිරීම තුළින් ආස්වාද ජනනය පිලිබඳ අදහස මෙම ලේඛකයා දන්නා පමණින් පළමුවරට ඉදිරිපත් කරන ලද්දේ නාට්‍ය ශාස්ත්‍ර කෘතියේ කතුවරයා ලෙස සැලකෙන භරත මුනිවරයා විසිනි. ඒ කරුණ හා ශෘංගාර රස ජනනයේ දී නිර්වේදය නමැති අනුභාවයේ අවශ්‍යතාවය අවධාරණය කිරීම තුළින්ය. පසුකාලීන සංස්කෘත න්‍යායාචාර්යවරයින් විසින් වර්ධනය කරන ලද සාධාරණීකරණ සංකල්පයේ අර්ථය වූයේ ද කලා කෘතියක ඉදිරිපත්කරනු ලබන චරිතයන් හා අනන්‍ය නොවී මගේය මගේ නොවේය ආදී වූ භේදයක් ඇති කොට නොගනිමින් කලා නිර්මාණය ආස්වාදය කිරීමය.

කලාවේ ඇති සමාජ සංසිද්ධීන් දුරස්ථ කිරීමේ ශක්තිය අවධාරණය කළ මුල්ම බටහිර විචාරකයා වූයේ 16/17 සියවස්වල මහා බ්‍රිතාන්‍යයේ ජීවත් වූ ෆ්‍රැන්සිස් බේකන් නමැති දාර්ශනිකයාය. ඔහු කලාවේ මෙම ශක්තිය හැඳින්වූයේ distancing power of art යනුවෙනි. 18 වන සියවසේ ඉපිද 19 වන සියවසේ මුල් දශකයේ මිය ගිය ජර්මන් ජාතික ඉමැනුවෙල් කන්ට් කලා ආස්වාදනය හා උපේක්ෂාව (disinterestedness) අතර සම්බන්ධතාවය නිරීක්ෂණය කළ තවත් ප්‍රධාන බටහිර විචාරකයෙකි.

කලාවේ මෙම භව්‍යතාවය යොදා ගනිමින් කලා නිර්මාණ තුළින් ආස්වාද ජනනය හා අවබෝධය යන අරමුණු දෙකම ඉටු කර ගැනීමේ ක්‍රමවේදයක් නිපද වූ දාර්ශනික කලාකරුවා වූයේ 20 වන සියවසේ ජර්මනියේ ජීවත් වූ බර්ටෝල්ට් බ්‍රෙෂ්ට්ය. කලා කෘතියක් තුළින් සමාජ අභිනයන් ප්‍රේක්ෂකයා හෝ පාඨකයා හමුවේ ආගන්තුකකරණයකට භාජනය කිරිමේ හැකියාව ඔහු පෙන්වා දුන්නේය.

ආසියානු රටවල කලාවේ, විශේෂයෙන්ම නාට්‍ය කලාවේ සහජයෙන්ම ආගන්තුකකරණ අර්ථයක් ඇති බව බ්‍රෙෂ්ට් නිරීක්ෂණය කළේය. බෙයිජිං ඔපෙරා රංගනවල, ජපන් නෝ හා කබුකි නාට්‍යයේ මෙන්ම සංස්කෘත නාට්‍යයේ ද ඔහු මේ ගුණය නිරීක්ෂණය කළේය. එසේ වුව ද ඔහු එම නිරීක්ෂණය තුළින් බැස ගත් නිගමනය වූයේ වර්තමාන යුගයේ අවශ්‍යතාවයන් අනුව මෙම ආගන්තුකකරණ උපක්‍රම යොදා ගනිමින් නාට්‍යයේ ප්‍රේක්ෂකයාට විචාරාත්මක නිරීක්ෂකයෙකු වීමේ හැකියාව ලබා දීමට හැකි බවය. එසේම ආගන්තුකකරණය මගින් භාවයන් ප්‍රතික්ෂේප කිරීමක් සිදු නොවන බවත් තමා ප්‍රතික්ෂේප කරන්නේ භාවයන් උද්දීපනය කළ හැක්කේ අනන්‍යකරණය තුළින්ය යන ග්‍රාම්‍ය සෞන්දර්යවිද්‍යාව බවත් අවධාරණය කළේය.

**කලාවේ ඇති ආස්වාද ජනන හැකියාව සහ සමාජය කෙරෙහි බලපෑමේ හැකියාව යන යන දෙපාර්ශ්වයම කෙරෙහි කලාකරුවනගේ හා කලා විචාරකයිනගේ පමණක් නොව දාර්ශනිකයන්ගේ ආගමික නායකයින්ගේ මෙන්ම දේශපාලන නායකයින්ගේද අවධානය ඉතිහාසය පුරා යොමු වී ඇත.**

වර්තමාන නාට්‍ය කලාවේ අරමුණ විෂයෙහි සිය අවසාන න්‍යායාත්මක ප්‍රකාශනය වූ "නාට්‍ය කලාවට කුඩා මෙවලමක්" ලේඛනයේ බ්‍රෙෂ්ට් මෙසේ සඳහන් කරයි: "අනෙක් හැම කලාවක් මෙන්ම නාට්‍ය කලාව ද ආරම්භයේ පටන්ම මිනිසුනට ආස්වාදය ලබා දීම සඳහා වූ ව්‍යාපාරයක් විය. නාට්‍ය කලාවට එයට සුවිශේෂ වූ ගරුත්වය ලබා දෙන්නේ මෙම අරමුණයි. නාට්‍ය කලාවට මෙම ආස්වාද ජනනය හැර වෙනත් බලපත්‍රයක් අවශ්‍ය නැත. එහෙත් එය නම් තිබිය යුතුමය. එය සදාචාරය සපයන්නක් බවට පත් කිරීමට අපට කිසි ලෙසකිනුත් නොහැකිය. එබඳු ප්‍රයත්නයකින් අප අතින් නාට්‍ය කලාවේ පදනම බිඳ දැමීමේ අවදානමක් නම් ඇති විය හැකිය. එසේ සිදු වන්නේ විශේෂයෙන්ම ඒ මගින් දීමට තැත් කරන සදාචාරාත්මක පාඩම ආස්වාද ජනක ලෙස ඉදිරිපත් නොවන විටය."

බටහිර ලෝකයේ බොහෝ විචාරකයින් විසින් බ්‍රෙෂ්ට් හඳුන්වනු ලැබ ඇත්තේ දේශපාලන කලාකරුවකු ලෙසය. එසේම මාක්ස්වාදියෙකු ලෙසය. එබැවින් කලාව පිලිබඳව එවැන්නකු මෙවැනි ප්‍රකාශයක් කරතියි සමහර මාක්ස්වාදීනට පවා පිළි ගැනීම අපහසුය. එපමණක් නොව ඔහු ජීවත්ව සිටි අවධියේ ප්‍රබලව පැවති සමාජවාදී යථාර්ථවාදය නමින් හැඳින්වුණු සෝවියට් නිල කලා ප්‍රවණතාවයේ අනුගාමිකයෝ ආකෘතිවාදියෙකැයි ඔහුට පරිභව කළහ. නාට්‍ය කලාව වර්තමාන යුගයට ගැලපෙන කලා මාධ්‍යයක් බවට පත් කිරීම සඳහා ස්වාභාවිකවාදය ප්‍රතික්ෂේප කරමින් ආගන්තුකකරණය අරමුණු කොට ගත් ආඛ්‍යාන රංග ක්‍රමයක් ගොඩ නැගීමට ඔහු විසින් කරන ලද ආකෘතිමය අත්හදා බැලීම් හා නිර්මාණ මෙයට ප්‍රධාන හේතූන් විය.

එසේ වුව ද බ්‍රෙෂ්ට් සාම්ප්‍රදායික ස්වාභාවික රංග ක්‍රමයේ සංඥා පද්ධතිය වෙනුවට හඳුන්වා දුන් නව සංඥා පද්ධතිය මෙන්ම ඒ මගින් නාට්‍යයේ තිබූ මායාරූපීබව ඉවත් වීම රෝලාං බාත් වැනි ඔහුගේ දේශපාලන ස්ථාවරය පිළි නොගත් පශ්චාද් නව්‍යවාදී විචාරකයින්ගේ ඇගයීමට ලක් විය.

බ්‍රෙෂ්ට් විසින් හඳුන්වා දෙන ලද මාර්ගය වූයේ කලාව හුදු ප්‍රචාරාත්මක අවියක් නොව ආස්වාදය තුළින් අවබෝධයක් ද ලබා දිය හැකි නිර්මාණාත්මක කාර්යයක් බවය. වර්තමාන කලාකරුවාගේ සමාජ වගකීම හුදු උපදෙස් දීමකට සීමා නොවන කලා විෂයක මෙහෙයක් බව නිගමනය කිරීමම බ්‍රෙෂ්ට් ලොව පුරා පිළිගැනීමක් ලැබූ කලාකරුවකු බවට පත් වීමට ද ප්‍රධානම හේතුව වීයයි කිව හැකිය.

මෙහි දී විශේෂයෙන් වැදගත් වන්නේ ෆැසිස්ට් ඒකාධිපතිවාදයට හා ධනවාදයට එරෙහිවත්, සාමයට හා සමාජ සාධාරණයට පක්ෂවත් පැහැදිලි ස්ථාවරයක් ගත් බුද්ධිමතකු වූ බ්‍රෙෂ්ට් වැන්නකු කලාවේ මූලික අරමුණ ආස්වාද ජනනයය යන නිගමනයට පැමිණීම මෙන්ම කලා කරුවාගේ ප්‍රධාන වගකීම මිනිසුන්ට ආස්වාදය ලබා දීමයයි තීරණය කිරීමය.

# පොදු අපේක්ෂකයා ජය ගත් පසු....

## ආර්ථික විද්‍යාඥයෙකුගේ යෝජනා කීපයක්




විහාර මහ දේවී උද්‍යානයේ දී 2014 දෙසැම්බර් 19 නිකුත් කරන ලද 'ප්‍රතිපත්ති ප්‍රකාශනය' ජාතික ප්‍රජාතන්ත්‍රවාදී පෙරමුණේ සංවර්ධන වැඩසටහනේ අරමුණු ප්‍රකාශයට පත් කරයි. මෙම වැඩපිළිවෙල ක්‍රියාශීලී හා කාර්යක්ෂම රාජ්‍ය-පුද්ගලික අංශ හවුල් ක්‍රියාදාමයක් මගින් ක්‍රියාවට නැගිය යුතුය.

- කුඩා ව්‍යාපාර හා ස්වයං රැකියාවන්හි නියුක්ත අය ද ඇතුළත්, ජාතික නිෂ්පාදනයෙන් 80% ට වඩා ප්‍රමාණයකින් දායක වන පුද්ගලික අංශය වර්ධනයේ යන්ත්‍රය (engine) වේ.
- රජයේ භූමිකාව විය යුත්තේ ඒ සඳහා අවශ්‍ය නෛතික-ආයතනික හා යටිතල පහසුකම් පරිසරය සම්පාදනය කිරීමයි.
- රජයේ භූමිකාවේ පදනම විය යුත්තේ යහ පාලනයේ ඉහළම ප්‍රතිපත්ති වන සමානාත්මතාව (සමාන අවස්ථා ලබා දීම හා ගජමිතුරුවාදය පිටු දැකීම); පාරදෘශ්‍යභාවය (විවෘතභාවය); වගවීම (පාර්ලිමේන්තුවට හා ජනතාවට) හා විශ්වාසදායකබව (නීතියේ පාලනය)යි.
- ප්‍රතිපත්ති සම්පාදනය සඳහා පුද්ගලික අංශයේ සහභාගීත්වය ද අවශ්‍යය. ඒ සඳහා පුද්ගලික අංශයේ නියෝජිතයන් සමාන බලතල සහිතව නියෝජනය වන ජාතික ක්‍රම සම්පාදක මණ්ඩලයක (Natioíl Planning Council 'NPC') උපදෙස් ලබා ගත යුතුය. ලේකම් මණ්ඩලයක සහාය ලබන ජාතික ක්‍රමසම්පාදක මණ්ඩලය ක්‍රමානුකූලව (සිව් මසකට වරක්) අගමැතිවරයා මගින් අමාත්‍ය මණ්ඩලයට වාර්තා සැපයිය යුතු වේ.
- අමාත්‍ය මණ්ඩලය ප්‍රධාන ක්ෂෙත්‍රයන් භාරව සිටින සාමාජිකයින් 30 කට සීමා කළ යුතුය. කැබිනට් මණ්ඩලයේ සාමාජිකයින්ට (ඇමතිවරුන්ට) උප ක්ෂේත්‍රයන් පිළිබඳව වග කිව යුතු හා ඇමතිවරුනට වාර්තා කළ යුතු නියෝජ්‍ය ඇමතිවරුන්ගේ (රාජ්‍ය ඇමතිවරුන්ගේ) සහාය ලබා ගත යුතුය. උදාහරණයක් ලෙස කෘෂිකර්ම අමාත්‍යංශය වතු වගා, සුලු භෝග වගා, සත්ව පාලන හා වාරි මාර්ග ආදී වශයෙන් රාජ්‍ය අමාත්‍යංශවලට බෙදිය හැකිය.
- සෑම රාජ්‍ය අමාත්‍යංශයකටම අමාත්‍යංශ ලේකම්ට වාර්තා සපයන රාජ්‍ය ලේකම්වරයෙකුගේ (අතිරේක ලේකම්වරකෙුගේ) සේවය අවශ්‍යය.
- අමාත්‍යංශ ලේකම්වරුන්ගේ කමිටුවක් පිහිටටවි යුතු අතර එය මනා සම්බන්ධීකරණය සඳහා සති පතා රැස් විය යුතු වන්නේය.
- රජයේ ආර්ථික ප්‍රතිපත්තියේ එක් ප්‍රධාන අංශයක් වන්නේ, කෘෂිකාර්මික අංශයේ, හා අනෙක් තරගකාරී ආනයන විකල්පයන් ධෛර්යමත් කරන අතරම භාණ්ඩ හා සේවා අපනයනය වැඩි දියුණු කිරීමයි.
- එබැවින් විශේෂයෙන් දේශීය පුද්ගලික අංශය සමග හවුල් කටයුතු කිරීමට ප්‍රමුඛත්වය දෙමින් විදේශීය ඍජු ආයෝජනයන් (FDI) උනන්දු කළ යුතුය.
- විදේශීය ඍජු ආයෝජනයන්ට අවසර දිය යුත්තේ ඒවා අපනයන සංවර්ධනයට දායක වන්නේ නම්, තාක්ෂණය ලබා ගැනීමට උපකාරී වන්නේ නම් හා රැකියා අවස්ථා නිර්මාණයට හේතුකාරක වන්නේ නම් පමණි.

**ආර්ථික ප්‍රතිපත්තීන් ක්‍රියාවට නැගීමට ප්‍රධාන බාධකයක්ව පවතින්නේ සම්බන්ධීකරණයේ දුර්වලතාවයයි**

- ආර්ථික ප්‍රතිපත්තීන් ක්‍රියාවට නැගීමට ප්‍රධාන බාධකයක්ව පවතින්නේ සම්බන්ධීකරණයේ දුර්වලතාවයයි. අපනයන ව්‍යාපාරයට ආධාර කරනු පිණිස අගමැතිවරයාගේ සභාපතිත්වයෙන් යුත් 'අපනයනකරුවන්ගේ සංසදයක්' ස්ථාපිත කළ යුතුය. එය අපනයන සංවර්ධන මණ්ඩලය (EDB), ආයෝජන මණ්ඩලය (BOI), වෙළඳ හා වාණිජ අමාත්‍යංශය, හා තානාපති කාර්යාලවල වාණිජ කටයුතු භාර ක්ෂේත්‍ර නිලධාරීන් අතර සම්බන්ධීකරණයක් ඇති කළ යුතුය. එහි සාකච්ඡවන්ගේ වාර්තා ඒවායේ ප්‍රධාන කාර්ය සාධක දර්ශකයන් හා පවරන ලද වගකීම් දක්වමින් අදාල රාජ්‍ය ආයතන හා ජාතික ක්‍රමසම්පාදක කවුන්සිලය අතර බෙදා හැරිය යුතුය.
- මේ වන විට පවතින යටිතල පහසුකම් සපයන ව්‍යාපෘතීන්ගෙන් උපරිම උපයෝගීතාවය ලබා ගනු සඳහා රජය ඒවා නවීකරණය කොට කාර්යක්ෂම කළ යුතුය. උදාහරණ ලෙස මත්තල ගුවන්තොටුපල, හම්බන්තොට වරාය, නොරොච්චෝලේ බලාගාරය, අධිවේගී මාර්ග වැනි සියලු යටිතල පහසුකම් හා සම්බන්ධ වාපෘතීන් ගත හැකිය.
- ආයෝජන දිරිමත් කිරීමේ අරමුණින් රජයේ රෙගුලාසි හා සේවා සැපයීම් පිළිබඳ ක්‍රියාකාරකම් නවීකරණය කොට කාර්යක්ෂම කළ යුතුය.
- සංචාරක ව්‍යාපාරය වැඩි දියුණු කිරීමේ කාර්යය සඳහා විශේෂ අමාත්‍යංශයක් පිහිටුවිය යුතුය.

ඉහත සඳහන් කිසිදු අරමුණක් ඉතා ප්‍රවීණ හා කැපවීමෙන් කටයුතු කරන රාජ්‍යසේවයක් නොමැතිව සාක්ෂාත් කොට ගත නොහැකිය. මේ හේතුව නිසා වෘත්තිකයින්ගෙන්, ශාස්ත්‍රාලීය උගතතුන්ගෙන්, පර්යේෂකයන්ගෙන් හා නිල බලයෙන් පත් කොට ගත්තවුන්ගෙන් සමන්විත ඉතා බලසම්පන්න පරිපාලන ප්‍රතිසංවිධාන කවුන්සිලයක් ස්ථාපිත කිරීම අවශ්‍යය. එය විධිමත් ලෙස හා ක්‍රමානුකූලව රාජ්‍ය පරිපාලන විෂය භාර ඇමතිවරයාගේ මාර්ග යෙන් අමාත්‍ය මණ්ඩලයට වාර්තා සැපයිය යුතු වන්නේය.

**කෞටිල්‍ය**

13 පිටුවෙන්

## ලංකා සම සමාජ....

සම්මත කරගන්නා ලදි. මේ කරුණු අනුසාරයෙන් කෙනෙකුට පැමිණිය හැකි එකම නිගමනය වන්නේ, ඒ වන විට ආණ්ඩුවෙන් ඉවත් වීමේ තර්ජනය පසුබිමේ ජාතික හෙළ උරුමය විසින් සම්මත කරගෙන තිබූ යෝජනාවන් මගින් ආණ්ඩුවට සිදුවිය හැකි නරක බලපෑම සමනය කර ගැනීම සඳහා, ලංකා සමසමාජ පක්ෂයට පිටස්තර යම් පිරිස් විසින් පක්ෂය පාවිච්චි කිරීමේ ප්‍රයත්නයක් දියත්ව තිබුණු බවයි. අද ලංකා සමසමාජ පක්ෂය, තවදුරටත් එන්.එම්. පෙරේරාගේ හෝ කොල්වින් ආර්. ද සිල්වාගේ හෝ බර්නාඩ් සොයිසාගේ හෝ සමසමාජ පක්ෂය නොවේ. ඒ වෙනුවට, 2010 සිට අපට ලැබී ඇත්තේ, ජනාධිපතිවරයාගේ අභිලාෂයන් සතපවන පරිද්දෙන් ප්‍රතිපත්තිමය තීන්දු තීරණ ගැනෙන, ස්වාධීන මතිමතාන්තරවලින් තොර සමසමාජ පක්ෂයකි. මේ අවස්ථාවේ ජනාධිපතිවරයාව අභියෝගයට ලක්කිරීම වනාහී ශ්‍රී ලංකාව නැවතත් යටත් විජිතයක් කිරීමේ අධිරාජ්‍යවාදී බලවේගවල කුමන්ත්‍රණයක් වශයෙන් හුවාදක්වීම සඳහා විමල් වීරවංශ සහ ඔහුගේ ගැත්තෙකු වන මුසාම්මිල් වැන්නන් සමග ඒකාබද්ධ සම්මුඛ සාකච්ඡා පැවැත්වීම මේ පක්ෂයට ඔක්කාරයක් ගෙන දෙන ප්‍රශ්නයක් වී නැත. පක්ෂයේ අතීත නායකයන් ඇපකැප වූ ප්‍රතිපත්තිවලින් අද පවතින සමසමාජ පක්ෂය මොන තරම් ඈත් වී ඇත්ද යන්න මනාව පෙන්නුම් කරන එක සාක්ෂියක් වන්නේ, එහි වර්තමාන නායක තිස්ස විතාරණ පවතින තත්වය යුක්ති සහගත කරමින්, එම පාලනයේ අන්ත දූෂණය පවා, සංවර්ධනය වන ඕනෑම රටක ස්වාභාවික ලක්ෂණයක් වශයෙන් අනුමත කිරීමට තරම් පහත් අඩියකට වැටීමෙනි.

එදා පක්ෂ නායකයන් ගර්හාවෙන් ප්‍රතික්ෂේප කළ ප්‍රතිපත්ති අද මේ පක්ෂය විසින් වගා කොට පෝෂණය කරනු ලැබීම තුළ, විශේෂයෙන් විධායක ජනාධිපති ක්‍රමය සම්බන්ධයෙන් එන්. එම්. පෙරේරා දරූ ප්‍රතිපත්තිය වර්තමාන පක්ෂ නායකත්වය විසින් පාවා දුන් තත්වය තුළ, පක්ෂයේ 79 වසරක සංවත්සරයක් පැවැත්වීමේ අයිතියක් වර්තමාන සමසමාජ පක්ෂයට ඇතැයි මම කොහෙත්ම නොසිතමි. වඩාත් සුදුසු වන්නේ, නව මාදිලියේ මේ පක්ෂයේ 4 වැනි සංවත්සරය සැප්තැම්බර් 8 වැනි දාට පැවැත්වීමයි. එම පක්ෂය නියෝජනය කරන පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් දෙන්නා 18 වැනි සංශෝධනයට පක්ෂව අත එසැවූයේ එවන් දවසක ය. ජනාධිපතිවරයාගේ අණවිනවලට අනුකූලව තමන් කවදත් අනුගත විය යුතු යැයි ඔවුන් තීන්දු කෙළේ එදා ය. එබැවින්, අළුත් පක්ෂයේ 4 වැනි සංවත්සරය සැප්තැම්බර් 4 වැනි දාට සැමරීම එම පක්ෂයට වඩාත් යෝග්‍ය ය.

ඉදිරිය
2014 දෙසැම්බර් 28 වන ඉරිදා










# දින සියයකින් අලුත් රටක්

විපක්ෂයේ පොදු අපේක්ෂක මෛත්‍රීපාල සිරිසේන සිය ජනාධිපතිවරණ ප්‍රතිපත්ති ප්‍රකාශනය ඉකුත්දා එළිදැක්වීය. ඒ සමග දින සියයක් ඇතුළත ක්‍රියාවට නංවන ක්ෂණික සහන වැඩසටහනක්ද ඉදිරිපත් කළේය. එහි මෙසේ දැක්වේ.

"පවුල්වාදී පාලනය සහ ඒකාධිපතිවාදය විසින් රටටත් ජන ජීවිතයටත් කරන ලද බිහිසුණු විනාශය නිසා මහජනයා දැඩි පීඩනයකට හා කම්පනයකට ලක්වී සිටිති. සාරධර්ම පිරිහී, සංස්කෘතිය සෝදාපාළුවී ගොස් තිබේ. දූෂණයද, භීෂණයද, නාස්තියද හේතුකොට ගෙන සමාජය දෙදරුම් කා ඇත. මේ හේතු කොට ගෙන හදිසි සහන ලබාදී ජන ජීවිතය මුදවාගෙන වහාම සමාජ ආර්ථික ප්‍රතිසංස්කරණ වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කොට රට යථා තත්ත්වයට පත් කළ යුතුව තිබේ"

විහාර මහා දේවි උද්‍යානයේදී විපක්ෂයේ පොදු අපේක්ෂකයාගේ ප්‍රතිපත්ති ප්‍රකාශනය එළිදැක්වීමේ අවස්ථා කීපයක් 'ඉදිරිය' කැමරා ඇසට හසුවූයේ මෙලෙසිනි.

ඡායාරූප-ශ්‍රීලාල්



**විධායක ජනාධිපති ධුරය අහෝසි කළ යුතුයි**
**- සමාජවාදී ජනතා පෙරමුණ (පුවතක්)**









මීගමුව, උතුරු කදිරාන, 3/181, ශ්‍රී ජිනවංශ නාහිමි පෙදෙසෙහි පදිංචි මයිකල් ප්‍රනාන්දු වන මා විසින් මත්තෙගොඩ, මත්ගොඩ පාරේ නො. 102/176 දරණ ස්ථානයේ පිහිටි සයුරි ප්‍රින්ටර්ස් ඇන්ඩ් පබ්ලිෂර්ස් මුද්‍රණාලයේ මුද්‍රණය කර ප්‍රසිද්ධ කරන ලදී.